# 2013 – 03 – 05 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **1.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| **2.** | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **3.** | ඒ. ජී. ලක්ෂමී හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **4.** | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **5.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **6.** | ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **7.** | ග්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **8.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **9.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. 09.30 ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.** ☸

**(01)**

**01:01 2013 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

2013 – 02 – 05 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිලිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 02 – 05 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>සංශෝධන 01</u>**

පිටු අංක 5 හි 3:3 යටතේ ගරු නගර සභ මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින් යන්න ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින් ලෙස නිවැරදි විය යුතුයි.

පිටු අංක 35 හි 12:8 යටතේ ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින් යන්න ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින් ලෙස නිවැරදි විය යුතුයි.

## 01:02 2013 – 03 – 01 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 03 – 01 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 03 – 01 දින පවත්වන ලද විශේෂ සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>

ඉදිරියේදි අපේ වෙබ් අඩවිය හැදුවහම සභාව අන්තර්ජාලයට දාන්න. එතකොට ඕන කෙනෙකුට ඕනම රටක ඉඳගෙන සභාව නරඹන්න පුළුවන්. අදාල දවසෙ රැස්වීම සංස්කරණය කරල ඉන්ටනෙට් එකට ඇතුල් කරන්න.

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

🕘 **පෙ. ව. 09.35 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

3:1 “ පරිගණක වැඩසටහන් මිලදී ගැනීම ” මැයෙන් ගණකාධිකාරීතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය මිල ගණන් කැඳවීම යටතේ සභාගත කරන ලදී.

🕘 **පෙ. ව. 09.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**3:2** “ දම්සෝ මේලා සැණකෙළිය ” මැයෙන් ධර්මාශෝක විද්‍යාලීය ආදිශිෂ්‍ය සංගමය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

විද්‍යලයේ සියවස සිපිරීම නිමිත්තෙන් සංවිධානය කරනු ලබන සැණකෙළිය සඳහා සහභාගි වන අමුත්තන් වෙනුවෙන් පවත්වන් භෝජන සංග්‍රහය සඳහා නගර ශාලාව මාර්තු 26 සිට මාර්තු 31 දින දක්වා රාත්‍රී 6.00 සිට රාත්‍රී 9.00 දක්වා කාලය තුල සහන මිලක් යටතේ ලබා දෙන මෙන් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මෙතන දවස් ගානක් සැණකෙළිය තියෙනවා. අපිට කොයි වෙලාවෙ එන්න වේවිද දන්නෙ නැහැ. අපිට අවශ්‍ය වෙලාවට එන්න යන්න අවසර තියෙන්න ඕනෙ සභාපතිතුමා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

නගර සභා මන්ත්‍රීවරයෙකුට ඕනම වෙලාවක නගර සභාවට යන්න එන්න පුළුවන්.

**<u>තීරණය</u>**

☞ **මේ සඳහා ශාලා ගාස්තුවෙන් 50% ක් අය කිරීමටත් විදුලිය සහ ජලය සඳහා සම්පූර්ණ ගාස්තු අය කිරීමටත් සභාව තීරණය කරන ලදී .**

**3:3** “ රථවාහන කෝන්ස් ලබා ගැනීම සඳහා ” මැයෙන් අම්බලන්ගොඩ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

නව රථවාහන සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමන්ලා ලබා දුන් සහයෝගයට ස්තුතිවන්ත වන අතර තව දුරටත් රථ වාහන සැළැස්ම ක්‍රියාත්මක කරගෙන යාම සඳහා රථවාහන කෝන්ස් 50 ක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

සංඝරාජ පාර සම්පූර්ණයෙන් වහනවා. කළුවඩුමුල්ල පාරෙ ප්‍රදේශවාසීන්ට ලොකු අසාධාරණයක් වෙනව මේක වහල තිබීමෙන්. එනිසා ඉක්මනින්ම මේක ලබා දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ පාරවල් වන්වේ කිරීමේදී අපි කිව්වෙ පුංචි පොල පාර හෝ දුම්රියපොල පාර දෙපැත්තටම ඇරිය යුතුයි කියල.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒගොල්ලන්ගෙ යෝජනාව තියෙන්නෙ දුම්රිය පොල පාර පිටවීම සඳහා දාන්න කියල. දැන් තියෙන්නෙ මහා වීදියට ඇතුල්වෙන්න. ඒක අනිත් පැත්තට තමයි ඒගොල්ලො යෝජනා කරල තියෙන්නෙ. මහා වීදියෙන් ගිහිල්ල දුම්රිය පොල පාරෙන් එළියට යන්න කියල කියන්නෙ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අනිවාරයෙන් ඒක වෙන්න ඕනෙ. මහජනතාව මෙතනින් ඇතුල් වුනහම කෙලින්ම යන්න ඕනෙ සතොස ගාවට ආපහු ගාළු පාරට යන්න. අපි එදත් කිව්වෙ එක්කො දුම්රිය පොල පාර දෙපැත්තම ඇරෙන්න ඕනෙ. නැත්තම් පුංචි පොල පාර තියෙන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

පුංචි පොල පාර වන් වේ කරේ නැහැ. පාසල් වෙලාවට විතරයි වහන්නෙ. එතන බෝඩ් එක ගැලවිලා තියෙන්නෙ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඔබතුමා කිව්ව හරි අපි යෝජනා කරේ පුංචි පොල පාර වහනව නම් උදේ 7.30 – 8.30 යි දවල් 1.00-2.00 යි . නමුත් එහෙම එකක් නෑ දැන් වහලම තියෙන්නෙ. ඊයෙ පෙරේද දවසක මට දුරකථනයෙන් කතා කරල මනුස්සයෙක් සෑහෙන දොස් කිව්ව.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මන්ත්‍රීතුමා ඕන කෙනෙකුට කියන්න අපි මේක අත්හදා බැලීමක් විතරයි. මාස තුනකටයි අපි දීල තියෙන්නෙ. ඒ මාස තුන ඇතුලත මහජනතාවගේ අදහස් බලල නැවතත් අපි නිවැරදි වෙන්න ඕන තැන් නිවැරදි කරනව කියල. ඒ අයගෙ විරෝධතාවය ලිඛිතව අපට එවන්න කියන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේක තාවකාලිකයි කිව්වට පොලිසියෙන් ලියනවා. ඒ නිසා මේ බෝඩ් වල හරියට ගලවන්න බැරි වෙන්න ලියන්න. පුංචි පොල පාර වන්වේ කරනව නම් සභාපතිතුමනි දුම්රියපොල පාර ගාළු පාරට එන්න ඉඩ අරින්න කියල ඉල්ලා සිටිනවා. නැත්තම් මේක ජනතාවට හිරිහැරයක් වෙනවා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේක අපි වෙනම කතා කරමු. ඒ අයත් ගෙන්නල. 19 වෙනිද වෙළඳ සංගමය සහ පොලිසියත් එක්ක තියෙන රැස්වීමට සියළු මන්ත්‍රීවරුන් එන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපි ගියවර සභාවකදි අපි කිව්ව මෙතන මුදල් ගන්න තැන පැයක් වහන්නෙ නැතුව පැය භාගයක් වහන්න කියල. නමුත් මෙතන බෝඩ් එක අනුව පැයක් වහල ඇතුල් වෙන්න බෑ. අසාධාරණය කරන්නෙ අම්බලන්ගොඩ ජනතාවට. අපි පිටින් එන වාහන සඳහා තමයි පාරවල් වහල ඔක්කොම කරන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේක අපි ඒ අයත් එක්කම කතා කරමු.

<u>තීරණය</u>

☞ **රථවාහන කොන්ස් 50 ක් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**පෙ. ව. 10.06 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**5:1:1 ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.**

**“ නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාස වල භාවිත වන දුරකථන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දීමට අවම මිල සහිත පැකේජයක් ලබා දී ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා කර සිටිමි.”**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය**

☞ **ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාසයන්හි භාවිත වන දුරකථන සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දී ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරීමට ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**5:2:1 ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා.**

**" ජාතික කියවීමේ මාසය වෙනුවෙන් දරණ ලද රු. 87864.00 මුදල සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කර සිටිමි."**

අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය මගින් ජාතික කියවීමේ මාසය අරමුණු කර ගනිමින් නගර සභා බල ප්‍රදේශයේ පාසැල් දරුවන් අතර පවත්වන ලද තරගාවලිය සහ ත්‍යාග ප්‍රදානෝත්සවය වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම ලෙස රු. 87744.00 සඳහා 2012-12-04 මාසික සභාවේ අංක 5:1:1 යටතේ අනුමැතිය ලබා දුන් බවත් එය රු. 87864.00 ලෙස සංශෝධනය විය යුතු බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

| | | | |
|---|---|---|---|
| ත්‍යාග සඳහා වියදම | - | රු. | 19490.00 |
| සහතික පත්‍ර සඳහා | - | රු. | 7875.00 |
| සමරු තිළිණ සඳහා | - | රු. | 8550.00 |
| විනිශ්චය මණ්ඩලයේ ගාස්තු සඳහා | - | රු. | 11000.00 |
| විනිශ්චය මණ්ඩලයේ සංග්‍රහ සඳහා | - | රු. | 2870.00 |
| ලිපිද්‍රව්‍ය සඳහා වියදම | - | රු. | 500.00 |
| උත්සව දින සංවිධාන වියදම | - | රු. | 9623.00 |
| උත්සව දින සංග්‍රහ සහ අතිරේක වියදම | - | රු. | 22046.00 |
| ඡායාරූප ඇල්බමය සඳහා | - | රු. | 5910.00 |
| | | රු. | **87864.00** |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය**

☞ **ඒ අනුව ජාතික කියවීමේ මාසය වෙනුවෙන් දරණ ලද රු. 87,864.00 ක මුදල සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**5:2:2 " නගර ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරණ ලද රු. 267526.50 සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කර සිටිමි."**

අම්බලන්ගොඩ නගර සභාව මගින් පාසැල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් සංවිධානය කරන ලද නගර ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම රු. 267526.50 සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

| | | | |
|---|---|---|---|
| ක්‍රීඩා භාණ්ඩ සහ උපකරණ සඳහා | - | රු. | 47160.00 |
| ක්‍රීඩා තරග සංවිධාන වියදම | - | රු. | 61181.50 |
| පදක්කම් සහ ශූරතා පළිහ සඳහා | - | රු. | 81760.00 |
| ලිපිගොනු කවර, සමරු කලාප, පෝස්ටර් සඳහා | - | රු. | 60875.00 |
| ඡායාරූප ඇල්බමය සඳහා | - | රු. | 7550.00 |
| වාදක කණ්ඩායම වියදම | - | රු. | 9000.00 |
| | | රු. | **267526.50** |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

<u>තීරණය</u>

☞ **ඒ අනුව නගර ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරණ ලද රු. 267526.50 සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 02- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**2013- 02- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013-02- 24 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 02- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**2013- 02- 21** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013-02- 21 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපේ කමිටු සාමාජිකයන් කිව්ව මන්ත්‍රීවරුන් දකින්න ආසයි කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ඒ ගැන කථා කරන කොට සභාපතිතුමනි අපි කමිටු වලට නොඑන හේතුවක් තියෙනවා. අපිම තමයි කාරක සභා වලට මේ අය නම් කරේ. ආවහම ඒ අය එනව නගරෙම පාලනය කරන්න. ඒකට බලයක් දීල නැහැ. වෙළඳ සංගමය නම් වෙළඳ සංගමය ගැන ඕන කතා කරන්න. පුස්තකාල කමිටුව නම් පුස්තකාල කමිටුව ගැන ඕනෙ කතා කරන්න. මම ප්‍රතිපත්තියක් වශයෙන් සියළුම කමිටු වලට එන එක නවත්තල තියෙන්නෙ ඒනිසයි.

**6: 3** **2013- 02- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන ක්‍රියාකාරී කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**සහභාගීත්වය** :

**ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මයා - ගරු සභාපති, නගර සභාව, අම්බලන්ගොඩ**
**එච්. එල්. අනුර කිත්සිරි මයා - නගර සභා මන්ත්‍රී, නගර සභාව, අම්බලන්ගොඩ**
**ආර්. පී. දේව් රෝහාන් මයා - නගර සභා මන්ත්‍රී, නගර සභාව, අම්බලන්ගොඩ**
**බී. එන්. ලාල් චන්ද්‍රසිරි මයා - සහකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක, රථ වාහන අංශය, පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ**
**ලලිත් හැලඹගේ මයා - සභාපති, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**අසිත ධනවංශ මයා - සම ලේකම්, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**සමන් අත්තනායක මයා - උප භාණ්ඩාගාරික, වෙළඳ සංගමය, අම්බලන්ගොඩ**
**ඩී. වී. සුනිල් මයා - ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ**
**මංජරී ත්‍යාගා සමරසේකර මිය - සංවර්ධන සහකාර, නගර සභාව, අම්බලන්ගොඩ**

01. පිළිගැනීම **- ගරු සභාපති, නගර සභාව**

- පියාපියෝ ආයතනයෙන් උත්තල දර්පණ 05 ක් සවි කිරීම සඳහා මුදල් ලබා දීමට නියමිත බව - **ගරු සභාපති, නගර සභාව**
- උත්තල දර්පණ සවි කිරීම සඳහා ස්ථාන 05 ක් හඳුනා ගත් බව හා එම ස්ථාන යෝජනා කරන බව. **- උපභාණ්ඩාගාරික,**
- බස් නැවතුම් පොළ ඉදිරිපිට - පුංචි පොළ පාර **වෙළඳ සංගමය**
- 5 වෙනි හරස් වීදිය (ASB වෙළඳසැළ පිහිටි මාර්ගය –
- කුලරත්න හන්දිය
- දුම්රිය පොළ පාර
- NDB බැංකුව ඉදිරිපිට හෝ නගර සභා පාර ඉදිරිපිට

❖ සෙලාන් බැංකුව අසළ දර්පණයක් සවි කිරීම අත්‍යාවශ්‍ය බවත් දර්පණ ලබා දෙන ලෙස සියලු ආයතන **- ගරු සභාපති, නගර සභාව** වලට ආරාධනා කරන බවත් දර්පණ වල ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු මතු නොවන බවත් දෙපසින්ම එන වාහන දර්ශනය වන හෙයින් දර්පණ සවි කිරීම සුදුසු බව. එමෙන්ම දොළොස් මහේ සේල් පොළ ඉදිරිපිට මහ අම්බලන්ගොඩ දෙසට හැරෙන මාර්ගය අසළ ද දර්පණයක් සවි කිරීම සුදුසු බව.

❖ පොලීසිය ඉල්ලා සිටි පරිදි මාර්ග සංඥා පුවරු ලබා දී ඇති බව. **- ගරු සභාපති**

❖ කුලරත්න මංසන්ධියේ මාර්ගයේ ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන ලකුණු කර නොමැති බව. **- සහකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක**

❖ කුලරත්න මංසන්ධියේ ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානයක් සඳහා ලකුණු කිරීමට නොගිය බව. **- ගරු සභාපති, නගර සභාව**

❖ බස් නැවතුම්පොළ පදික මාරුව රාත්‍රී කාලයේ දී අඳුරු බැවින් වීදි ලාම්පු සවි කිරීම සුදුසු බව. - **ස. මූලස්ථාන පොලිස් පරීක්ෂක**

❖ නගර සභාව විසින් එම ස්ථානයේ වීදි ලාම්පු සවි කළ නමුත් සවි කළ දිනට පසු දිනම විදුලි බල මණ්ඩලය **- ගරු සභාපති, නගර සභාව** විසින් වීදි ලාම්පු ඉවත් කිරීමට කටයුතු කළ බව.

❖ එසේ වීදි ලාම්පු ඉවත් කිරීමට හේතුව කුමක්ද යන්න. **- සම ලේකම්, වෙළඳ සංගමය**

❖ එසේ සවි කරන ලද වීදි ලාම්පු සඳහා විදුලි බිලක් ගෙවීමට සිදු වීම එයට හේතුව බව. **- ගරු සභාපති, නගර සභාව.**

❖ බස් නැවතුම් පොළ ඉදිරිපිට රාත්‍රී කාලයේ දී අඳුරු ස්වභාවයක් ගන්නා බැවින් එම ස්ථානයේ විදුලි බල්බ **- සහකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක** සවි කිරීම හෝ LCD SyStem Light සවි කිරීමට හැකියාව ඇති ද යන්න පිළිබඳව සොයා බලන ලෙස.

❖ බස් නැවතුම් පොළ ඉදිරිපිට අඳුරු බව නැති කිරීම සඳහා තාක්ෂණ වාර්තාවක් සහ ඇස්තමේන්තුවක් සකස් **- ගරු සභාපති, නගර සභාව .** කිරීමට කර්මාන්ත අධිකාරීට දැන්වීම සුදුසු බව.

➢ **බස්නැවතුම් පොළ ඉදිරිපිට අඳුරු බව නැති කිරීම සඳහා තාක්ෂණ වාර්තාවක් සහ ඇස්තමේන්තුවක් නගර සභා වැඩ අධිකාරීගෙන් ලබා ගැනීමට කමිටුව තීරණය කරන ලදී.**

- පදික වෙළෙඳුන් බොහෝ දෙනෙක් නගරයෙන් පිටත අය බවත් ඉදිරියේ දී උත්සව කාලය පැමිණෙන බවත් එවිට පදික වෙළෙඳුන් ඉවත් කිරීම අපහසු වන බවත් ඒ සඳහා මේ වන විටම ක්‍රියාත්මක වීම සුදුසු බවත් පෙන්වා දෙන ලදී. - **සභාපති, වෙළඳ සංගමය**
- පොලීසිය හා එක්ව නගර සභාව සිදු කරනුයේ පදික වෙළෙඳුන් ඉවත් කිරීම බවත් ඉදිරි උත්සව කාල සීමාව තුළදී මෙය ගැටලුවක් වන බවත් නගරයේ පදික වෙළෙඳුන් විසින්ම මේ සඳහා ක්‍රියාත්මක වන්නේ නම් වඩා සුදුසු බවත් ඒ අය වෙනුවෙන් මැදිහත් වීමට අපට සිදු වී ඇති බවත් පෙන්වා දෙන ලදී. - **ගරු සභාපති, නගර සභාව**

- ප්‍රචාරක දැන්වීම් පුවරු මාර්ගයේ ප්‍රදර්ශනය කිරීමේ දී නගර සභාවට මුදල් ගෙවීමක් සිදු කරන බවත් ඉන්පසු මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම් කරන ලෙසත් එසේ නොගෙවන්නේ නම් පුවරු ඉවත් කිරීමට පවසන බවත් එය එසේ සිදු වන්නේ කොසේද යන්න. - **උපභාණ්ඩාගාරික, වෙළඳ සංගමය**
- නගර සභාව ලබා ගනුයේ ප්‍රදර්ශන ගාස්තුවක් බවත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබා ගනුයේ ඒ අයට අයත් බිම භාවිත කිරීම වෙනුවෙන් බිම් බද්දක් බවත් එය ගෙවිය යුතු බවත් පෙන්වා දෙන ලදී. - **ගරු සභාපති, නගර සභාව**

- නගර සභා මාර්ගවල නම් සඳහන් නාම පුවරු මෙල්වා ආයතනය විසින් සකස් කර දී ඇති බවත් වර්ෂයකට පමණ පසුව වෙනත් ආයතනයකට නාම පුවරු සකස් කිරීමට භාර දිය යුතු බවත් නගරයට ඇතුළු වීමේ ස්ථාන 06ක් පවතින බවත් එම ස්ථාන වල නගර නාම පුවරු සවි කළ යුතු බවත් කාර්ය සාධන තරඟවල දී පවා නගර නාම පුවරු සවි කර තිබු විට ලකුණු හිමි වන බව. - **ගරු සභාපති, නගර සභාව**

- කොට්ඨාස මට්ටමින් ඩෙංගු තුරන් කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන බවත් ඒ සඳහා පොලීසියේ සහභාගීත්වය ද අපේක්ෂා කරන බව. එමෙන්ම මදුරුවන් බෝවන ස්ථාන පිළිබඳව විශේෂයෙන් සොයා බලා ඒ ස්ථාන සඳහා දැන්වීම් යවන බවත් සමහර ස්ථාන නිරීක්ෂණයේ දී පිළිසකර කළ යුතු වැසිකිළිවලවල් නැවත සකස් කර ගැනීමට හැකියාවක් නොමැත්තන් හමු වු බවත් එවැනි අය පිළිබඳව සොයා බලා සභා අරමුදලින් හෝ පිළිසකර කර දිමට තීරණය කරන ලද බවත් මෙම ව්‍යාපෘතියට සහභාගී වන නිලධාරීන් වෙනම ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන බවත් පෙන්වා දෙන ලදී. - **ගරු සභාපති, නගර සභාව**

- කොට්ඨාසයට අදාළ වු ව්‍යාපෘති දිනයේ දී කොට්ඨාසය භාර පොලිස් නිලධාරි මහතා සහභාගී කරවිය හැකි බව. - **සහකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක,**

- මෙම ව්‍යාපෘතිය වඩා හොඳ බව. - **වෙළඳ සංගම් නියෝජිතවරු**
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ එක්ව අයාලේ යන බල්ලන් සඳහා වඳ සැත්කම් වෙරළ උද්‍යානයේ දී කළ බවත් ඒ සඳහා රු.1300/- ක පමණ මුදලක් එක් බල්ලෙකු සඳහා දැරීමට සිදු වන බවත් මෙම ක්‍රියාවලිය සඳහා යන වියදම අධික හෙයින් රාජ්‍ය නොවන සංවිධානයක අනුග්‍රාහකයෙකු ලබා ගැනීමට හැකියාව තිබේද යන්නත් සිංහ සමාජයෙන් යම් මුදලක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී . - **ගරු උපසභාපති, නගර සභාව**
- ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස. - **සමලේකම්, වෙළඳ සංගමය**
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර සිංහ සමාජයට ඉදිරිපත් කරන ලෙස. - **ගරු සභාපති, නගර සභාව**
- කුලරත්න මංසන්ධිය වැනි ස්ථානවල මාර්ග තදබදයක් මේ වනවිට නොපවතින බවත් ඒ සඳහා අම්බලන්ගොඩ පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපති විසින් ගන්නා උත්සාහය පිළිබඳව වෙළඳ සංගමය වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත් එමෙන්ම නව රථ වාහන සැළැස්ම නීතී ගත කිරීම පිළිබඳවත් විමසන ලදී. - **සමලේකම්, වෙළඳ සංගමය**
- මෙය නීතීගත කිරීමට පෙර නිරීක්ෂණ කාල සීමාවක් ලෙස ක්‍රියාත්මක වන බවත් මේ වන විට මෙම සැළැස්ම - **ගරු සභාපති, නගර**

සම්බන්ධව චෝදනා ලැබෙන බවත් ඒ පිළිබඳව ද විමසිය යුතු බවත් පෙන්වා දෙන ලදී. **සභාව**

- සාමාන්‍ය සේවා බස් තවමත් සෙමින් යන බවත් එබැවින් නගරය තුළ මාර්ග තදබදයක් බවතින බවත් ඒ ගැන සොයා බැලිය යුතු බවත් පොලීසිය විසින් ඒ සඳහා පියවර ගත යුතු බවත් පෙන්වා දෙන ලදී. **- ගරු නගර සභා මන්ත්‍රී, අනුර කිත්සිරි මහතා**
- කොට්ඨාස රැස්වීමේ දී ද මෙම කරුණ පිළබඳව සාකච්ඡා කළ බවත් එහිදී පැවසුයේ බස් රථ වල ගමන් වාර වෙනස් කළ යුතු බවයි. නමුත් එය ක්‍රියාත්මක නොවූ බව ද එබැවින් නැවත මෙම කරුණ පිළිබඳව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට දැන්විය යුතු බවත් පවසා සිටින ලදී. **- සහකාර මූලස්ථාන පරීක්ෂක**
- නගරය පුරා රථ වාහන තදබදය ඇති වීමට මූලික හේතුව මෙය බවත් මෙම බස් රථ වල ගමන් ගන්නා ජනතාවටද කරනු ලබන අසාධාරණයක් බව. **- ගරු සභාපති, නගර සභාව**
- බස් නැවතුම් පොළ ඉදිරිපිට ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ආයතනවලට ලබා දීම හේතුවෙන් කරදරකාරී තත්වයක් ඇති වී ඇති බව. එමෙන්ම ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීම ප්‍රධානතම ගැටලුව බවත් ප්‍රවර්ධන වාහනය පමණක් නොව එම ආයතනයේ අනෙකුත් වාහන ද බස් නැවතුම් පොළ ඉදිරිපිට නවතා තබන බව. **- සම ලේකම්,වෙළඳ සංගමය**
- පොලීසිය ශබ්ද විකාශන භාවිත කිරීම පිළිබඳව විමසා බැලීමට ගිය විට නගර සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ඉදිරිපත් කරන බවත් පොලීසිය විසින් ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කිරීමට බලපත්‍රයක් ලබා නොදෙන බව. **- සහකාර මූලස්ථාන පොලිස් පරීක්ෂක**
- ඔරලෝසු කණුව ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ අනෙක් පස ඇති බිම් තීරුව මෙම ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යොදා ගැනීම සුදුසු බවත් බස් නැවතුම් පොළේ ඇති පොලිස් බැරැක්කය අසළ ත්‍රීරෝද රථ නැවැත්වීම සඳහා භාවිත කිරීම සුදුසු බව. **- උපභාණ්ඩාගාරික, වෙළඳසංගමය**
- පොලිස් බැරැක්කය නැවත සකස් කිරීමට ඉදිරියේ දී ක්‍රියාකරන බැවින් එම ස්ථානය භාවිත කරන හෙයින් එම ස්ථානය වෙනත් දෙයකට භාවිත නොකරන ලෙස. **- සහකාර මූලස්ථාන පරීක්ෂක**

02. **රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.** **- ගරු නගර සභා මන්ත්‍රී,**

- ස්තුති කථාව කිරීම සහ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම. **අනුර කිත්සිරි මහතා**

**2013- 02- 19** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන ක්‍රියාකාරී කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -02- 19 දින පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලැබූ ක්‍රියාකාරී කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 02- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**සහභාගිත්වය-**

| | |
|---|---|
| ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මයා | - ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.එල්.අනුර කිත්සිරි මයා | - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව. |
| ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මයා | - ගරු නගර සභා මන්ත්‍රී , අම්බලන්ගොඩ නගර සභාව. |
| පී.අශෝක කුමාර මයා | - ක්‍රීඩා භූමි උපදේශක, අම්බලන්ගොඩ නගර සභාව. |
| ඉදුනිල් එදිරිවික්‍රම සූරිය මයා | - පා පන්දු පුහුණුකරු , අම්බලන්ගොඩ නගර සභාව. |
| ආර්.එස්.ගිනීගේ මයා | - ක්‍රීඩා නිලධාරි , අම්බලන්ගාඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය. |
| එන්.එච්.වී.සී. ද සිල්වා මයා | - ක්‍රිඩා ආචාර්ය, ධර්මාශෝක විද්‍යාලය. |
| ඩබ්ලිව්.ඒ.පී. ගුරුසිංහ මයා | - ක්‍රිඩා ආචාර්ය, ධර්මාශෝක විද්‍යාලය. |
| කේ.පී.තාලෙව් මයා | - රියෝ ක්‍රීඩා සමාජය |
| මහේන්ද්‍ර වික්‍රම සිංහ මයා | - ක්‍රිඩා කමිටු සාමාජික |
| ඩබ්ලිව්.ෂර්ලි චන්ද්‍රසිරි මයා | - ක්‍රිඩා කමිටු සාමාජික |
| ඩී.වී.තරංගි මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරි , අම්බලන්ගොඩ නගර සභාව. |

**ගරු සභාපතිතුමා**

ක්‍රීඩා කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන්, ක්‍රිඩා නිලධාරිතුමා, පාසල් හා ක්‍රිඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළුම නිලධාරින්, ක්‍රිඩා කමිටු සාමාජික මහතුන් සහ නගර සභාවේ නිලධාරින් පිළිගැනීම හා පසුගිය සභා වාරයේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය කිරීම.

ධර්මාශෝක විද්‍යාලය මගින් සංවිධානය කරන ලද Relay carnival එකේ දී ක්‍රීඩාංගනය මඩ වීම නිසා ගැටළු ඇතිවුයේ ද යන්න විමසීම හා තමන් රැස්වීමක සිටිය දී ක්‍රීඩා නිලධාරි ජාලිය මහතා කථාකර මේ බව දන්වමින් මඩ වී ඇති ස්ථාන වලට ලී කුඩු දැමීමට අවසර ඉල්ලා සිටි අතර එම අවස්ථාවේ දී සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙසට උපදෙස් ලබා දෙන ලද බව.

**ඩබ්ලිව්.ඒ.පී. ගුරුසිංහ මහතා**

මඩ වී ඇති ස්ථාන වලට ලී කුඩු දැමීම සුදුසු නොවන බව හා තරග ආරම්භයට පෙර ළමයි විසින් එම මඩ ඉවත් කර පස් දමා ධාවන පථ සකස් කර ගත් බව.

**ක්‍රීඩා භූමි උපදේශක පී.අශෝක කුමාර මහතා**

මඩ වී ඇති ස්ථාන වල ලී කුඩු දැමීම සුදුසු නොවන අතර මේ පිළිබඳ ගරු සභාවේ තීරණයක් ද ගෙන ඇති බැවින් ලී කුඩු දැමීමට ඉඩ නොදුන් බව.

**ගරු සභාපතිතුමා**

එම අවස්ථාවේ සුදුසු අන්දමින් ක්‍රියාකර සාර්ථකව කටයුතු කිරීම පිළිබඳව සියළු දෙනාට ස්තුතිය පළ කිරීම.

✓ **තීරණය - ක්‍රීඩාංගනය මඩ වී ඇති අවස්ථාවල ලී කුඩු නොදැමිය යුතු බව.**

**එන්.එච්.වී.සී.ද සිල්වා මහතා**

ක්‍රීඩාංගනය මඩ වීම වැළැක්වීම සඳහා කානුවක් බැඳීම සුදුසු බව.

**ගරු සභාපතිතුමා**

මෙම ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය සඳහා වන ඇස්තමේන්තුව රුපියල් කෝටි එකහමාරක් වේ. අපට ලැබුණ ජාතික සවිය මුදල් ද මම මේ සඳහා වෙන් කිරීමට යෝජනා කරනු ලැබුවත් දිස්ත්‍රික් කමටු රැස්වීමේ දි අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා කියා සිටියේ ක්‍රිඩා අමාත්‍යංශයට යෝජනා ඉදිරිපත් කරන ලෙසයි. අපේ අයවැයෙන් ද මුදල් වෙන් කර තිබෙන බැවින් අදියරෙන් අදියර මේ කටයුතු සිදු කරමු.

**රන්සින් ගිණිගේ මහතා**

බද්දේගම කුම්මේ ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ වෙනුවෙන් මුදල් වෙන් කර ඇති බැවින් පළාත් සභා ප්‍රතිපාදන ද මේ සඳහා වෙන් කර ගැනිමේ හැකියාවක් නොමැති අතර ක්‍රිඩා අමාත්‍යාංශය හරහා මුදල් වෙන් කර ගැනීමට තමා ද උපරිමයෙන් කටයුතු කරන බව.

**ඩබ්ලිව්.ඒ.පී. ගුරුසිංහ මහතා**

දුර පනින ස්ථානය ගඩොල් පේළියක් බැඳ වැලි දමා සකස් කර ඇති අතර Runner up සෑදිය යුතු බව.

**ක්‍රීඩා භූමි උපදේශක පී.අශෝක කුමාර මහතා**

ධර්මාශෝක විද්‍යාලය මගින් සංවිධානය කරන මාර්තු මාසයේ පැවැත්වීමට නියමිත Carnival පසු එම අවශ්‍යතාවයන් ඉටු කර දිය හැකිය.

**ඩබ්ලිව්.ඒ.පී. ගුරුසිංහ මහතා**

ධාවන පථ වෙනස් වී ඇති බැවින් මිනින්දෝරු කෙනෙකු ගෙන්වා මැන අලුතින් සකස් කර දෙන ලෙස ඉල්ලීම.

**ගරු සභාපතිතුමා**

මේ සඳහා ටෙන්ඩර් කැඳවා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබා දීම.
ක්‍රීඩා මණ්ඩපය සඳහා පුටු 240 ලබා දී ඇති අතර එම පුටු ප්‍රමාණවත් ද යන්න විමසීම.

**ක්‍රීඩා භූමි උපදේශක පී.අශෝක කුමාර මහතා**

එම පුටු ප්‍රමාණවත් බව හා පුටු එළියට රැගෙන යාම වැළැක්වීම සඳහා දම්වැලක් දමා පොළොවට සවිකිරීම සුදුසු බව.

ක්‍රීඩා මණ්ඩපයේ වහළ ක්‍රීඩාංගනය දෙසට තිබීමෙන් ක්‍රීඩා මණ්ඩපයේ දර්ශනීය බව නැති වී ඇති අතර කිසිම ක්‍රීඩා මණ්ඩපයක් ක්‍රීඩාංගනය දෙසට වහල් පළ තිබෙන ලෙස ඉදි නොකරන බැවින් වහළ ඉදිරියෙන් උස් කර දෙන ලෙස හා ක්‍රිඩා මණ්ඩපයේ ඇති පුටු ආරක්ෂා කර ගැනීම සඳහා අඩි 06 පමණ උසට ග්‍රීන් නෙට් එකක් සවිකර දෙන ලෙස ඉල්ලීම.

ක්‍රීඩාංගණයේ ඇති දර්ශන පථය (Side Screen) අබලන් වී ඇති අතර විකට්ටුව කෙළින් ද පිහිටුවා නැති බව.

**ගරු සභාපතිතුමා**

ක්‍රීඩා මණ්ඩපයේ වහළ වෙනස් කිරීම පිළිබඳ තාක්ෂණ සේවා නිලධාරින්ගෙන් විමසිය යුතු බව.

අඩි 10 පමණ පීළි මතින් ඇද ගෙන යන දර්ශන පථයක් (Side Screen) ලබා දිය හැකි බව.

තල්ගස්ගොඩ ප්‍රදේශයේ ක්‍රීඩාංගනය ඉදි කිරීම සඳහා අත්පත් කරගත් ඉඩම බැලීමට ගියේද යන්න විමසීම. අක්කර තුනකට වැඩි එම භූමිය සඳහා යාබද වෙලෙන් ද තවත් මීටර 400 පමණ ගැනීමට කටයුතු කරමින් පවතින අතර එහි මීටර 400 ධාවන පථයක් සහිත අංග සම්පූර්ණ ක්‍රීඩාංගනයක් ඉදි කිරීමට අදහස් කරගෙන සිටින බව. මෙම භූමිය ශුද්ධ කිරීමට ලක්ෂ තුනක මුදලක් වැය කරන ලද අතර සමතලා කිරීමට ලක්ෂ විස්සක පමණ මුදලක් වැය වේ. සම්පූර්ණ ඉදි කිරීම් කටයුතු සඳහා කෝටි දෙකක පමණ මුදලක් වැයවනු ඇති බව. හා එහි ඉදි කිරීම් සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් හා යෝජනා ලබා දෙන ලෙස ඉල්ලා සිටිම.

- ✓ **තීරණය - ක්‍රීඩා මණ්ඩපයේ වහල හා ග්‍රීන් නෙට් එක ඉදි කිරීම පිළිබඳ තාක්ෂණ සේවා වාර්තාවක් ගරු සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.**

**එන්.එච්.වී.සී.ද සිල්වා මහතා**

ධර්මාශෝක හා දේවානන්ද Big match මාර්තු මස 16,17 පැවැත්වෙන බැවින් ඊට පෙර ක්‍රිඩා මණ්ඩපය පින්තාරු කර ප්‍රතිසංස්කරණ කළ යුතු තැන් ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ඉල්ලා සිටිම.

වයස අවු. 15 න් පහළ අන්තර් පාසල් ක්‍රිකට් තරග ආරම්භ කිරීමට පෙර නගර ක්‍රිඩා ක්‍රිකට් තරග පැවැත්වීම සුදුසු බව හා විනිශ්චය සඳහා පාසල් හා ක්‍රිඩා සමාජ නියෝජනය කරන ක්‍රිඩකයන් යොදා නොගෙන දකුණු පළාත් විනිසුරු සංගමයෙන් විනිසුරුවන් ලබා ගැනීම සුදුසු බව. මෙම තරගාවලියේ අරමුණ පැහැදිලි කර විනිසුරු සංගමයේ සභාපති වෙත දැන්වීමෙන් නොමිලේ විනිසුරුවන් ගේ සේවය ලබා ගත හැකි බව.

- ✓ **තීරණය - නගර ක්‍රිඩා ක්‍රිකට් තරගාවලියේ විනිශ්වය සඳහා දකුණු පළාත් විනිසුරු සංගමයේ සහයෝගය ලබා ගැනිමට කටයුත කිරීම.**

**ගරු සභාපතිතුමා**

Big match ආරම්භ කිරීමට පෙර අදාළ ප්‍රතිසංස්කරණයන් හා පින්තාරු කිරීම සිදු කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

පා පන්දු පුහුණු කිරීම මානාන ක්‍රිඩාංගනට රැගෙන යා හැකිද යන්න විමසීම.

**ඉදුනිල් එදිරිවික්‍රමසූරිය මහතා**

එම ක්‍රිඩාංගනය පාසල් හා නගරයෙන් ඇතුළට වෙන්න තිබෙන නිසා ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් ගැටළු ඇති වන බව.

නගර සභා පාපන්දු සංචිතයේ ක්‍රිඩකයන් සඳහා කාය වර්ධන ව්‍යායාම සිදු කිරීමට මසකට දෙවරක් වත් අවස්ථාව ලබා දෙන ලෙස රියෝ හා සිංහ ක්‍රිඩා සමාජ වලින් ඉල්ලා සිටීම.

**ගරු සභාපතිතුමා**

මේ පිළිබඳව ක්‍රීඩා සමාජවලින් ලිඛිතව ඉල්ලීමක් කරන ලෙසට උපදෙස් ලබා දීම.

**ඉඳුනිල් එදිරි වික්‍රමසූරිය මහතා**

2012 වසරෙ පැවැත්වු වයස අවු. 17 න් පහළ නගර ක්‍රීඩා පාපන්දු තරගාවලියෙන් දක්ෂ ක්‍රීඩකයන් 30 කු තෝරා ගෙන ඇති අතර ඔවුන් පුහුණු කර ඉදිරියේ දී පැවැත් වීමට නියමිත ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් සංවිධානය කරනු ලබන F.A කුසලාන තරගාවලියට හා යු.ඩබ්ලිව්.සුමතිපාල අනුස්මරණ තරගා වලියට සහභාගි කිරීමට ගරු සභාවේ අනුමැතිය ඉල්ලා සිටීම හා ඔවුන්ට අවශ්‍ය ක්‍රීඩා උපකරණ පන්දු සපත්තු තරගා වලිය සඳහා සහභාගි වීමට අවශ්‍ය ගමන් වියදම් ද ලබා දෙන ලෙස ඉල්ලා සිටීම.

**ගරු සභාපතිතුමා**

මෙවර නගර සභා පාපන්දු සංචිතය සඳහා තෝරා ගන්නා ලද ක්‍රීඩකයන් පිළිබඳ තොරතුරු හා F.A කුසලානයට සහභාගි කිරීමට අදාළ වියදම් ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටීම.
නගර සභා පාපන්දු සංචිතයෙන් පුහුණු වීම් ලබා පසුව එම ක්‍රීඩකයන් වෙනත් නමකින් ක්‍රීඩා කිරීම පිළිබඳ විමසීම.

**ඉඳුනිල් එදිරි වික්‍රමසූරිය මහතා**

මීට අවුරුදු කිහිපයකට පෙර ගරු සභාපතිතුමාගේ යෝජනාවක් අනුව වයස අවු. 17 න් ඉහළ නගරයේ හා අවට පාසල් ඒකරාශි කොට පාපන්දු තරගාවලියක් පවත්වා දක්ෂ ක්‍රිඩයන් 20 කු තෝරා නගර සභා පාපන්දු සංචිතය නමින් පුහුණු වීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ අතර එම ක්‍රීඩකයන් සඳහා අවශ්‍ය ක්‍රිඩා උපකරණ, පා පන්දු, සපත්තු ඇතුළු සියළුම පහසුකම් ඉතා විශාල මුදලක් වැයකර නගර සභාව මගින් ලබා දෙන ලදි. සංචිතයේ පුහුණු කටයුතු මා වෙත පවරනු ලැබු අතර මා එම කටයුතු අඛණ්ඩව සිදුකරනු ලැබීය. ඒ අනුව කොළඹ සෝන්ඩර්ස් ක්‍රිඩා සමාජය සංවිධානය කරනු ලැබු යු.ඩබ්ලිව්.සුමතිපාල අනුස්මරණ පාපන්දු තරගාවලිය සඳහා කණ්ඩායම ඉදිරිපත් කරනු ලැබු අතර සමස්ථ ශූරතාවය දිනා ගැනීමට අප කණ්ඩායමට හැකි විය. එම ක්‍රිඩකයන් දිගින් දිගටම පුහුණු කටයුතු සිදුකරනු ලැබු අතර ඔවුන් පාසල් අධ්‍යාපනයෙන් ඉවත් වීමත් සමග රැකියා අවශ්‍යතාවයන් මතු විය. ඒ අනුව විලේගොඩ පදිංචි කර්නල් මහින්දසිරි මහතා හමුවු අවස්ථාවකදී ඔහු සේවය කරන ගජබා රෙජිමේන්තු කණ්ඩායමට එම ක්‍රිඩකයන් ඇතුළත් කරන ලෙස මාගෙන් ඉල්ලීමක් කරන ලද අතර ක්‍රිඩකයන් සමග සාකච්ඡා කර ගජබා රෙජිමේන්තු කණ්ඩායමට එම ක්‍රිඩකයන් ඇතුළත් කරනු ලැබීය.එම ක්‍රීඩකයන් දක්ෂ ලෙෂ අම්බලන්ගොඩ කෙටේරියන්ස් නමින් ක්‍රීඩාකරමින් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2011 වර්ෂයේ ප්‍රීමියලිග් III කණ්ඩායේ ශූරතාවයද 2012 වර්ෂයේ II කාණ්ඩයේ ශූරතාවයද හිමිකර ගනිමින් අම්බලන්ගොඩ නගරයට කීර්තියක් හිමිකර දෙනු ලැබීය. එහි ගෞරවය ඔබතුමා ඇතුළු නගර සභාවට ද හිමිවන බව.

**ගරු සභාපතිතුමා**

අපේ ක්‍රිඩකයන් එලෙස දක්ෂතා පෙන්වීම ගැන සතුටට පත්වන බව හා රැකියා අවශ්‍යතාවය මත එලෙස කටයුතු කිරීම ගැටළුවක් නොවන බව. මෙවර සංචිතයට තොරාගත් ක්‍රිඩකයන්ට ද අඛණ්ඩව හොඳ පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලෙස හා ඒ සඳහා අවශ්‍ය සියළු පහසුකම් නගර සභාව මගින් ලබා දීමට සූදානම් බව.

**ගරු නගර සභා මන්ත්‍රී එච්.එල්. අනුර කිත්සිරි මහතා**

අද දින ක්‍රීඩා කමිටුවට පාසල් ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් හා ස්වේච්ඡාවෙන් පැමිණ නගරයේ දරුවන්ගේ සුභ සිද්ධිය හා සමෘධිමත් ක්‍රිඩාවන් ගොඩනැගීම වෙනුවෙන් තම වටිනා අදහස් පළ කිරීම සම්බන්ධයෙන් සියළුම මහත්ම මහත්මීන්ට ස්තුතිය පළ කර සිටින බව.

සකස් කළේ - ඞී. වාසනා තරංගි මිය , ප්‍රජා සංවර්ධන නිලධාරී.

**2013- 02- 20** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -02- 20 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** **2013- 02- 17** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**<u>සහභාගීත්වය</u>**

- ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා — සභාපති, අම්බලන්ගොඩ නගර සභාව.
- එච්. එල්. අනුර කිත්සිරි මහතා — නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.
- ජේ. ඩබ්.ජයන්ත මහතා — නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව.

- වෛද්‍ය ජී ආර් එන් ද සිල්වා මිය — සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, අම්බලන්ගොඩ,
- ඞී වී සුනිල් මහතා — ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව.
- එච් .එච්. ජයසේන මහතා — ම. සෞ. පරීක්ෂක, අම්බලන්ගොඩ නගර සභාව.
- ඞී වී තරංගි මිය — ප්‍රජා සංවර්ධන නිළධාරී, අම්බලන්ගොඩ නගර සභාව.
- පී. එච්. එල් සී පුෂ්පරාණි මහත්මිය — සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව,
- ඩබ්. එන්. අයි. මෙන්ඩිස් මහතා — ම. සෞ. පරීක්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, අම්.
- එච්. එච්. නිහාල් රණසූරිය මහතා — ම. සෞ. පරීක්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, අම්.
- එච්. නුවන් රත්නවීර මහතා — පොලිස් ස්ථානය, අම්බලන්ගොඩ.
- කේ. ශාන්ති මිය — ගොවිජන සංවර්ධන නිළධාරී, අම්බලන්ගොඩ.
- එස්. ඞී. නන්දනී මිය — ප්‍රාදේශීය පරිසර නිළධාරී, අම්බලන්ගොඩ.
- එච්. එච්. ඒ. ද සිල්වා මහතා — ග්‍රාම නිළධාරී, ඕකන්ද.
- එම්. ඩබ්. හිරාන් සංජීව මහතා — සෞඛ්‍ය පරිපාලක, අම්බලන්ගොඩ නගර සභාව.
- එම්. එච්. පත්මසේන මයා — සෞඛ්‍ය පරිපාලක, අම්බලන්ගොඩ නගර සභාව.

**පිළිගැනීම** :- ගරු සභාපති එම්.ඩබ්. අරුණ පදීප් මහතා.

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව සඳහා පැමිණි නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්.ජයන්ත මහතා , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමිය ඇතුළු සියලු නිලධාරී මහත්ම මහත්මීන් හා අනෙකුත් සියළුම රජයේ නිලධාරීනුත් , නගර සභා කාර්ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වූ කරුණු සමාලෝචනයක යෙදීමයි.

**ඩෙංගු මර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

| | | |
|---|---|---|
| ම. සෞ. ප. නිළධාරී<br>එච්. එච්. ජයසේන මහතා | : | නගර සභා බල ප්‍රදේශයේ ඩෙංගු රෝගය මර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩ සටහනක් සකස්කර සභාවේ අනුමැතිය ලැබී ඇති අතර, මේ වන විට ග්‍රාම නිළධාරී වසම් හතරක ශ්‍රමදාන කටයුතු අවසන් කර ඇත. 2013-02-14 දින විලේගොඩ ග්‍රාම නිළධාරී වසමතුල ශ්‍රමදාන කටයුතු සිදු කිරිමේදී එක් නිවසක වැසිකිළි වල බොහෝ සෙයින් බැස තිබූ බවත් එය යථා තත්වයට පත්කරන ලෙස උපදෙස් දුන් බවත් පවසන ලදි. හීගල්දුව පාර, හීන් ඇල පාර, පටබැඳිගෙදර දෙවට II යන ස්ථාන වලින් ඩෙංගු රෝගීන් වාර්තා වී ඇති අතර ඒ සෑම ස්ථානයකම ධුමායන කටයුතු සිදුකර ඇති බවත් පැවසීය. |
| නගර සභා මන්ත්‍රී<br>ජේ. ඩබ්.ජයන්ත මහතා | : | දුම්රිය පාර දිගේ ඇති කාණුව තුළ නිතර ජලය රැඳී පවතින බව ප්‍රකාශ කරන ලදි. |
| ගරු සභාපති<br>ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | : | මහජන බැංකුව අසල සිට දුම්රිය මාර්ගය දක්වා දිවෙන මාර්ගයේ කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම සඳහා වැඩ අධිකාරී මගින් ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස දන්වන ලදි. |
| ම. සෞ. ප. නිළධාරී<br>ඩබ්. එන්. අයි. මෙන්ඩිස් මහතා | : | හිරේවත්ත ග්‍රාම නිළධාරී වසමතුළ සමහර ගොඩනැගිලිවල උඩු මහල සකස් කිරීම සඳහා දමා ඇති කොන්ක්‍රීට් තට්ටුව මත ජලය රැඳී තිබෙනු දුටු බවත් ඒ අයට ඒ බව දැනුම් දුන් අතර, එය යථා තත්වයට පත් කිරීමට පොරොන්දු වූ බවත් පවසන ලදි. |
| ගරු සභාපති<br>ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | : | එම ස්ථානවල අවශ්‍ය පියවර නොගන්නේ නම් ඒ සම්භන්ධව දඩ ගැසීම හෝ නඩු පැවරීම සිදුකල යුතු බන පවසන ලදි. |
| නගර සභා මන්ත්‍රී<br>ජේ. ඩබ්.ජයන්ත මහතා | : | මහ වීදියේ වෙළඳ සැල් පිටුපස වතුර රැදෙන ස්ථාන තිබෙන බවත් එම වෙළඳ සැල්වලට ඇතුළු වී ඇතුළෙන් ගොස් පරීක්ෂා කළ යුතු බව පවසන ලදි. |
| ගරු සභාපති<br>ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | : | එය සත්‍යක් බවත් ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන ලෙසත් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් වෙත උපදෙස් ලබාදුනි. හිරේවත්ත වඩු කර්මාන්තය පිළිබඳව පැමිණිලි ලැබී ඇති බැවින් ඒ පිළිබඳ වර්තමාන තත්වය කුමක් ද යන්න විමසන ලදි. |

මහජන සෞඛ්‍ය පරීක්ෂක : ඔවුනට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව පවසන ලදී .
එච්.එච් ජයසේන මහතා

ගරු සභාපති : එම වඩු කර්මාන්තය සඳහා පරිසර බලපත්‍රය ලබා ගෙන තිබේද එසේ නැතිනම් බලපත්‍රය
ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා ලබා දිය යුත්තේ මෙම ආයතනයෙන්ද යන්න විමසන ලදි.

පරිසර නිලධාරී : වඩු කර්මාන්ත සඳහා අදාළ පළාත් පාලන ආයතනයෙන් බලපත්‍රය නිකුත් කළ යුතු බවත් ,
එස්. ඩී. නන්දනී මිය වෙළඳ බලපත්‍ර ලේඛණය අනුව බලපත්‍රය ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන සඳහා පරිසර බලපත්‍ර ලබා ගන්නා ලෙස ලිපි යැවීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති : සියළු දෙනාම ඒකරාශී වී පරිසර බලපත්‍ර ලබාගත යුතු ස්ථාන සොයාබලා බලපත්‍ර ලබාදීමට කටයුතු
ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කරන ලෙස දන්වන ලදි. කළුවඩුමුල්ල ප්‍රදේශයේ අවිදිමත් ලෙස කසළ බැහැර කරන කිහිප දෙනෙක් අල්ලා දඩ ගැසීම සම්බන්ධව මුලස්ථාන පොලිස් පරීක්ෂක තුමාට ස්තූතිය පුද කරන බවත් එම ප්‍රශ්නය තරමක් දුරට විසඳී ඇති බවත් ප්‍රකාශ කරන ලදි.

**වෙනත් කරුණු :**

නගර සභා මන්ත්‍රී බරවා රෝගය සඳහා රුධිරය පරීක්ෂාව මේ දිනවල සිදු කරන්නේ ද යන්න විමසන ලදි
ජේ. ඩබ්.ජයන්ත මහතා

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී : මේ දිනවල එම රුධිර පරීක්ෂාව සිදු කරන බවත් ,ඉදිරියේදීත් සිදු කරන බවත් පවසන
වෛද්‍ය පී ආර් එන් ද සිල්වා මිය ලදි.

මහජන සෞඛ්‍ය පරීක්ෂක : සෞඛ්‍ය අංශයේ සේවකයන් මාස 03 ට වරක් වත් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කළ
එච්.එච් ජයසේන මහතා යුතු බව.

සභාපති : සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමියට මෙවැනි සායනයක් පැවැත්වීමේ හැකියාව තිබේද යන්න විමසන ලදි.
ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී : වෛද්‍ය සායනයක් පැවැත්වීමේ හැකියාව ඇති බව පවසන ලදි.
වෛද්‍ය පී ආර් එන් ද සිල්වා මිය

සභාපති : එම සායනය පැවැත්වීමේදී වෛද්‍ය පරීක්ෂණ හා බෙහෙත් සඳහා යන වියදම් සභාවෙන් දැරීමට හැකි

ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා බවත් මාස 03 ට වරක් එම සායන පැවැත්විය යුතු බවත් පවසන ලදි.

ග්‍රාම නිළධාරි, ඕකන්ද. : පොල්වත්ත පාරෙන් විහාරගොඩ පාරට හැරෙන ස්ථානයේ බෝක්කුව අවහිර වී ඇති බව.
එච්. එච්. ඒ. ද සිල්වා

සභාපති : එම අවහිරතාව ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් අවශ්‍ය නම් එම ස්ථානයට
ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා පෙට්ටි බෝක්කුවක් දැමීම සඳහා වැඩ අධිකාරි මගින් ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී

ග්‍රාම නිළධාරි, ඕකන්ද. : පොල්වත්තපුර කාණු පද්ධතිය අවහිර වී ඇති බව.
එච්. එච්. ඒ. ද සිල්වා

සභාපති : මම මෙම ස්ථානය පරීක්ෂා කළ බවත් එක් නිවසක වැසිකිළිවල කාණුව උඩ සකස් කර
ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා ඇති නිසා මෙම ගැටළුව මතුවී ඇති බවත් එම නිසා වැසි ජලය කාණුවෙන් ඉවතට ගලා යන බවත් ප්‍රදේශයේ මන්ත්‍රීතුමාට මේ පිළිබඳව දැන් වූ බවත් පවසන ලදි.ඉදිරියේදී මෙම කාණුව කොන්ක්‍රීට් කිරීමට බලාපොරොත්තු වන බවත් පවසන ලදි.

මහජන සෞඛ්‍ය පරීක්ෂක : සුනඛ වන්ධ්‍යානරන සැත්කම අද දින පටබැඳිමුල්ල ප්‍රජා ශාලාවේ සිදු කරන බවත් ගැහැණු සතුන් 100
එච් එච් ජයසේන මහතා ක් සඳහා මෙම සැත්කම සිදු කිරීමට අපේක්ෂිත බවත් පැවසීය.සෞඛ්‍ය අමාත්‍යංශය, රාජ්‍ය නොවන සංවිධානයක මුල්‍ය දායකත්වය ඇතිව, ව්‍යාපෘතියක් වශයෙන් මෙම වැඩ සටහන ක්‍රියාත්මක කරන බවත්, සැත්කම සිදු කරන ලද සතුන් හඳුනා ගැනීම සඳහා කනෙන් කොටසක් කපන බවත් පවසන ලදි.නගර සභා බල ප්‍රදේශය සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක වනුයේ එක් දිනක් පමණක් බවත් පවසන ලදි.

සභාපති : මෙම වැඩසටහන තව දුරටත් ක්‍රියාත්මක කළ නොහැකි ද යන්න විමසන ලදි.
ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා

මහජන සෞඛ්‍ය පරීක්ෂක : එක් සුනඛ සැත්කමක් සඳහා රු.1000.00ක් ද සුනඛයන් අල්ලන පුද්ගලයාට එක් සුනඛයෙක් සඳහා
ඩබ්. එන්. අයි. මෙන්ඩිස් මහතා රු.350.00 ක මුදලක් ද ලබා දිය යුතු අතර , ඒ අනුව එක් සුනඛ සැත්කමක් සඳහා රු.1350.00 ක් වැය වන බවත් පෙන්වා දෙන ලදි. අයාලයේ යන සුනඛයින් සඳහා වන්ද්‍ය සැත්කම සිදු කිරීම පිළිබඳ සියළු දෙනා සාකච්ජා කරන ලදි.

සභාපතිතුමා : මේ පිළිබඳ වාර්තාවක් සකස් කර අවශ්‍ය තීරණ ගැනීම සඳහා සභාවට යොමු කරන ලෙස
ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා උපදෙස් දෙන ලදි.

**<u>ස්තුති කථාව</u>**

| | | |
|---|---|---|
| නගර සභා මන්ත්‍රී | : | අද දින රැස්වීම සඳහා පැමිණි සභාපති තුමාටත් වෛද්‍යතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් නගර සභා |
| ජේ. ඩබ්.ජයන්ත මහතා | | ලේකම් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කරන ලදී. |

ප.ව. 3.30 ට පමණ රැස්වීමේ කටයුතු නිමා කරන ලදී.

**2013- 02- 17** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -02- 17 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

<u>ටෙන්ඩර්</u> :-

**7:1:1** පරිගණක වැඩ සටහන් මිලදී ගැනීමට අදාලව මිල ගණන් විමසනු ලදුව ඉදිරිපත් වී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන සහිත ටෙන්ඩරය පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ටෙන්ඩර්කරුගේ නම | මුදල රු. | වෙනත් කරුණු |
|---|---|---|---|
| 01 | Global Town Suit | 26,00,000/- | |
| 02 | Science Land Software (Pvt) Ltd | 8,00,000/- | |
| 03 | වයඹ පළාත් සභාව - වයඹ සංවර්ධන අධිකාරිය | 6,30,000/- | |

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ වැඩේ හොඳයි. ඒ නිසා මේක අරගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මෙය අපි අනුමත කරන අතර මීට වසර 3 කට පෙර මම පැහැදිලි කිරීමක් කරා අපගේ තිබෙන ලේඛන ස්කෑන් කරල සංරක්ෂණය කරන්න කියලා. නමුත් ඒකට ඇහුන්කම් දීමක් සිදු වුනේ නැහැ. මගේ හිතවත් සහෝදරයෙක් මාර්ගයෙන් මේ කටයුත්ත නොමිලේ කරන්න එතුමා අවස්ථාවක් ලබල දුන්නා. මම සභාවේදි අවස්ථා දෙක තුනකදි මේ ගැන ප්‍රකාශ කරා. මේ දේ නොදැනුවත්කමද අවශ්‍යතාවයක් නැති කමද මම දන්නෙ නැහැ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

දැනට පරිගණක තාක්ෂණය ඉහල මට්ටමක තිබුනත් අපේ නිලධාරීන්ට හැදෙන්න කාලයක් ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි එදා ඒ දේ කරේ නැහැ. අද ඒකෙ වටිනාකම කෝටි ගානක්. මේ සුරක්ෂිතභාවය නොමිලේ කරගන්න තිබුණ දෙයක්. අපි මන්ත්‍රීවරුන් විදියට කියන දේටත් පොඩි ඇහුන්කම් දීමක් වත් සිදුවුනේ නැහැ. ඒ දේවල් වලටත් යොමු වීමක් වෙන්න කියල මම ඉල්ලීමක් කරනවා.

**7:1:2** අම්බලන්ගොඩ, තල්ගස්ගොඩ පිහිටි තල්ගස්ගොඩබැද්ද නම් ඉඩම මතුපිට ක්‍රීඩාපිටියක් සඳහා සමතල කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලදුව ඉදිරිපත් වී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන සහිත ටෙන්ඩරය පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | සභාවේ රේට් මුදල | සභාවේ ඇස්තමේන්තු මදුල | සභාපති, එකමුතු ග්‍රාමීය සමෘද්ධි බලකාය, **86D,** තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ | | ඩී. කේ. එස්. බිල්ඩර්ස්, **273/1,** පාසල් කන්ද මාවත, කුරුඳුගහහැතැප්ම, කරන්දෙනිය | | ඊ. එච්. ලයනල්, පිලාන, වංචාවල, ගාල්ල | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | රේට් | මුදල | රේට් | මුදල | රේට් | මුදල |
| 1 | - | 4000/- | - | 5000/- | - | 7500/- | - | 6000/- |
| 2 | 369/- | 1861974/- | 230/- | 1160580/- | 310/- | 1564260/- | 340/- | 1715640/- |
| | | **1865974/-** | | **1165580/-** | | **1571760/-** | | **1721640/-** |

**7:2** **<u>මිල ගණන්</u>** :-

**7:2:1** රට උළු මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත අවම මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඒ. පී. පී. මෙන්ඩිස් | පී. ඩබ්. ඉන්දික | ස්ටර්ලින් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 01 | රට උළු | 100 | **45/-** | 48/- | - |
| | | | | | |

**7:2:2** බීකන් ලාම්පු සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩෙල්ටා ඉලෙක්ට්‍රිකල්ස් | සන්වේ ඉලෙක්ට්‍රිකල්ස් | ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් |
|---|---|---|---|---|---|
| 01 | 400W බීකන් ලාම්පු (අංග සම්පූරණ) | 01 | 11000/- | 11500/- | 10500/- |
| | | | | | |

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,**</u>

සභාපතිතුමනි ලයිට් ගැන කතා කරන කොට කියන්න ඕනෙ රණසූරිය පාරෙ ලයිට් නෑ. ඔක්කොම බිඳල. වාහනේකින් ඇර පයින් නම් යන්නම බැහැ. ඒකට ලයිට් දාල ආවරණයක් දාන්න.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

ලයිට් බිඳපුව දාන්න. ඒවගේම මගෙන් අද බස් රථ හිමියන්ගෙ සංගමෙන් ඇවිල්ල ඇහුව ඒ පාරෙ අඩි 3 ගානේ පාර දෙපැත්ත සුද්ද කරන්නද කියලා. මම කිව්ව කමන්නෑහැයි කියල.

**7:2:3** White Board සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ෆා එන්ටර්ප්‍රයිසස් | පූර්ණ හාඩ්වෙයාර් | කුමාර ග්ලාස් |
|---|---|---|---|---|---|
| 01 | White Board 24"X24" | | 900/- | 1000/- | 1000/- |
| 02 | White Board 24"X34" | | 1350/- | 1450/- | 1400/- |
| | | | | | |

**7:2:4** ඖෂධ පත්‍රිකා සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | ඩී. ආර්. එස්. ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ඖෂධ වර්ග වැයවීම පිළිබඳ දෛනික සටහන් (දී ඇති ආකෘතිය අනුව) | 500 | 17/50 | 23/- | 20/50 |
| | | | | | |

**7:2:5** සින්ක් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ශ්‍රීසිරි ඉන්ඩස්ට්‍රීස් | නන්දන පීවීසී | |
|---|---|---|---|---|---|
| 01 | සින්ක් බේසින් | 01 | 2000/- | 2050/- | |
| 02 | වේස්ට් | 01 | 350/- | 500/- | |
| 03 | ෆ්ලෙක්සිබල් හෝස් | 01 | 175/- | 160/- | |
| 04 | බේසින් ටැප් | 01 | 450/- | 850/- | |
| | | | | | |

**7:2:6** Virus Guard සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | LSJ Computers | Ramcy Computers | Shiva Computers |
|---|---|---|---|---|---|
| 01 | Printer Installer | | 300/- | 450/- | 450/- |
| 02 | Hard disk virus clean | | 1500/- | 1800/- | 1700/- |
| 03 | Install windows 7 and software | | 1700/- | 2300/- | 1800/- |

**7:2:7** ෆෝමිකා ෂීට් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Fa Enterprises | Kumar Glass | BKS Company |
|---|---|---|---|---|---|
| 01 | ෆෝමිකා ෂීට් | 04 | 1250/- | - | - |
| | | | | | |

**7:2:8** ගබඩා භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Fa Enterprises | Purna Hardware | BKS Company |
|---|---|---|---|---|---|
| 01 | 4” X 2” පිත්තල සරනේරු | | 130/- | 120/- | 180/- |
| 02 | පිත්තල ජනෙල් හැඩල් | | 165/- | 125/- | 175/- |
| 03 | පිත්තල හුළං කොකු | | 165/- | 125/- | 175/- |
| 04 | පිත්තල ජනෙල් මුදු | | 45/- | 45/- | 70/- |
| 05 | 3/8” X 8’ X 4” ප්ලයිවුඩ් ෂීට් | | 2350/- | - | 2265/- |
| 06 | 6-3/4” ඇණ | | 7/23 | 7/- | 8/04 |
| 07 | 5-5/8” ඇණ | | 5/- | 5/- | 5/95 |
| 08 | 31/2” පීරිමාක් පීරි | | - | 135/- | 295/- |

**7:2:9** ගබඩා ලේබන ලිපි ශීර්ෂ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් | ඩී.ආර්.එස්. ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ගබඩා ලේබන ( දී ඇති ආකෘතිය අනුව) | 10 | 925/- | 1450/- | 1125/- |
| 02 | සාමාන්‍ය ලිපිශීර්ෂ පොත් | 50 | 195/- | 210/- | 222/50 |
| | | | | | |

**7:2:10** පෞද්ගලික ලිපිගොනු කවර සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් | ඩී.ආර්.එස්. ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | පෞද්ගලික ලිපිගොනු කවර | | 172/- | 190/- | 220/- |
| | | | | | |

**7:2:11** වානේ අල්මාරි සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පත්මා ෆරනිචර | ඩයමන්ඩ් බ්‍රදර්ස් | එවරෝ ෂෝරූම් |
|---|---|---|---|---|---|
| 01 | වානේ අල්මාරි | 01 | 10500/- | 16000/- | 11065/- |
| | | | | | |

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>

හිරේවත්තට වානේ අල්මාරි දෙන්න එපා. ලී වලින් හදල දෙන්න.

## (08) ගෙවීම්

8. 1 ඇ. අංක 0416 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 17500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

AT පෝරම 17.50 X 1000 = 17500.00

8.2 ඇ. අංක 0415 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 32125/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| පොත් තුණ්ඩු | .75 X 5000 | = | 3750.00 |
| පොත් සාක්කු | 3.75 X 5000 | = | 18750.00 |
| දින පත්‍රිකා | 1.15 X 5000 | = | 5750.00 |
| පරිසර ආරක්ෂණ බලපත්‍ර | 77.50 X 50 | = | 3875.00 |
| | | | 32125.00 |

8.3 ඇ. අංක 0424 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද විදුලි උපාංග වෙනුවෙන් කොළඹ 11 , පළමු හරස් වීදිය, අංක 95 A ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 93750/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| 1/044 Wire Roll | = | 1600 X 5 | = | 8000.00 |
| 13 A Plug | = | 375 X 20 | = | 7500.00 |
| 5 A Plug base | = | 350 X 20 | = | 7000.00 |
| Mercury bulb | = | 390 X 100 | = | 39000.00 |
| Auto switch | = | 950 X 05 | = | 4750.00 |
| Arms | = | 275 X 50 | = | 13750.00 |
| Shade | = | 275 X 50 | = | 13750.00 |
| | | | | 93750.00 |

8. 4 ඇ. අංක 0413 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ඔරෙන්ජ් සී එෆ් එල් බල්බ් වෙනුවෙන් ඔරෙන්ජ් අලෙවි නියෝජිත වතුගෙදර කේ. ඩී. බී. ආර්. ප්‍රනාන්දු මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 184400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| Orange CFL Bulb | = | 461 X 400 | = | 184400.00 |

8.5 ඇ. අංක 0426 යටතේ ධීවර සංකීර්ණය වෙත ලබා ගත් ඇඳි රහිත ප්ලාස්ටික් පුටු වෙනුවෙන් අම්බලන්ගොඩ, පත්මා ලිබඩු ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 214500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ඇඳි රහිත ප්ලාස්ටික් පුටු | 300 X 715/- | - | 214500.00 |

8.6 ඇ. අංක 0379 යටතේ ලබා ගන්නා ලද පෙර පාසල් නිල ඇඳුම් රෙදි වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාළු පාර, ස්පයිඩර් ගාමන්ට් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 71400/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ෂර්ට් රෙදි | 210 y X 170/- | - | 35700.00 |
| කලිසම් රෙදි | 210 y X 170/- | - | 35700.00 |
| | | | 71400.00 |

8.7 ඇ. අංක 0402 යටතේ කාර්යාලයට ලබා ගන්නා ලද වානේ කැබිනට්ටු වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, දුම්රියපොල පාර, ඩයමන් බ්‍රදර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 21700/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Steel Cabinet | 10850 X 2 | = | 21700.00 |

8.8 ඇ. අංක 0412 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද දැව වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි කුරුඳුවත්ත, වතුගෙදර, හංස එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 11200/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ගිනි සපු ලෑලි දික් අඩි | 80 X 140/- | = | 11200.00 |

8.9 ඇ. අංක 0298 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගල් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි තිලකපුර, අම්බලන්ගොඩ, බී. ඒ. කාන්ති මිය වෙත රු. 10300/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Chips Cubes | 01 X 5500/- | - | 5500.00 |
| 6 X 9 Metal Cubes | 2 X 2400/- | - | 4800.00 |
| | | | 10300.00 |

8.10 ඇ. අංක 0419 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගෑස් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 37.5 kg Gas | 08 X 7240/- | - | 57920.00 |

8.11 ඇ. අංක 0387 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ග්ලවුස් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, මහා වීදියේ රාජපක්ෂ ස්ටෝර්ස් වෙත රු. 12500/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Gloves pairs | 50 X 250 | - | 12500.00 |

8.12 ඇ. අංක 0360 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද සිමෙන්ති වෙනුවෙන් අම්බලන්ගොඩ, මහා වීදියේ, බී. කේ. එස්. කම්පැනි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 20460/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Cement | 22 X 930/- | - | 20460.00 |

8.13 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11746.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3727 | ඩීසල් | 57 |
| 3736 | ඩීසල් | 40 |

8.14 නගර සභාව සතු 49-9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12671.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3713 | ඩීසල් | 35 |
| | Engine Oil | 01 |
| 3724 | ඩීසල් | 36 |
| | Engine Oil | 02 |
| 3732 | ඩීසල් | 19 |
| | Engine Oil | 01 |

8.15 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10997.80 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3720 | ඩීසල් | 39 |
| | Engine Oil | 02 |
| 3731 | ඩීසල් | 39 |
| | Engine Oil | 02 |

8.16 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 ජනවාරි මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15985.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3707 | ඩීසල් | 132 |

8.17 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 21434.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3750 | ඩීසල් | 50 |
| 3751 | ඩීසල් | 58 |
| 3763 | ඩීසල් | 69 |

8.18 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 14755.10 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3742 | ඩීසල් | 51 |
| 3760 | ඩීසල් | 70 |

8.19 නගර සභාව සතු 49-9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 2013 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11746.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|

| | | |
|---|---|---|
| 3746 | ඩීසල් | 33 |
| 3756 | ඩීසල් | 22 |
| 3764 | ඩීසල් | 42 |

8.20 නගර සභාව සතු 49-9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10562.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර |
|---|---|---|
| 3749 | ඩීසල් | 37 |
| | Engine Oil | 01 |
| 3761 | ඩීසල් | 42 |
| | පවර් ස්ටියරින් ඔයිල් | 01 |

8.21 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 ජනවාරි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15985.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර |
|---|---|---|
| 3740 | ඩීසල් | 132 |

8:22 2012 දෙසැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම්

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 II | 8,662.08 |
| 23453 II | 5,634.90 |
| 34453 II | 992.80 |
| 52453 II | 9,172.30 |
| 62453 II | 14,169.52 |
| | **38, 631.60** |

ජල බිල්පත් සඳහා රු. **38,631.60** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:23 2012 දෙසැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52454 | 19,591.35 |
| 52453 I | 33,750.15 |
| 62453 I | 15,714.53 |

| | |
|---|---|
| 34453 I | 5,878.51 |
| 23453 I | 1,329.38 |
| 11453 I | 42,106.40 |
| | 118,370.32 |

විදුලි බිල්පත් සඳහා රු: **118,370.32** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:24 2012 නොවැම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 30,604.33 |
| 12452 | 1,163.28 |
| 25451 II | 2,696.87 |
| 62452 I | 1,433.12 |
| | 35,897.60 |

දුරකතන බිල්පත සඳහා රු: **35,897.60** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8.25 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සඳහා 2013 ජනවාරි මාසයට ලබා ගත් පුවත්පත් වෙනුවෙන් රු. 35300.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 කළුවඩුමුල්ල සිරි විජයාරාමය අසළින් යන මාර්ග සති පාර ප්‍රතිසංස්කරණය වෙනුවෙන් අදාල රුදවුම් මුදල වන රු. 98000.00 ක මුදලක් බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 හිරේවත්ත ප්‍රජාශාලා ගොඩනැගිල්ල පෙර පාසලක් සඳහා ප්‍රතිසංස්කරණය සහ සෙල්ලම් මිදුලක් තැනීම වෙනුවෙන් අදාල රුදවුම් මුදල වන රු. 77265.05 ක මුදලක් වෙරළ පාර 01, ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි එතන පොඩි අඩුපාඩු වගයක් තියෙනවා. ඒ අඩුපාඩු ටික හදවන්න සභාපතිතුමනි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම ඒක එදාම හදන්න කිව්වා වැඩ අධිකාරීතුමාට.

8.28 නගර සභාව සතු අංක LF- 1853 දරණ ටිපර් රථයේ රක්‍ෂණ වාරිකය වෙනුවෙන් රු. 28299.24 ක මුදලක් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 නගර සභාව සතු අංක LF- 1853 දරණ ටිපර් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම වෙනුවෙන් රු. 30705/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි කාර්යාලයේ මෙච්චර මෙවලම් තියෙද්දි නියමිත වෙලාවට මේව කරන්න බැරිනම් ඒක ලැජ්ජාවට කරුණක්. මේව පරිගණක ගත කරල නියමිත දිනයන්ට මේ දේවල් කරන්න.

8.30 2013 ජනවාරි මාසයේ එකතු කරන ලද වරිපනම් බදු වෙනුවෙන් රු. 26628.48 ක මුදලක් එච්. ටී. සී. එච්. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 කේ. ලංකා ද සිල්වා මහතාට හිමි විය යුතු ඇප මුදල වන රු. 16253.22 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 2013 ජනවාරි මස VAT මුදල් රු. 50000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 මුදල් රක්‍ෂණය වෙනුවෙන් රු. 38018.32 ක මුදලක් ලේකම්ගේ හා නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 2013-03-01 දින පොත් මිළදී ගැනීම වෙනුවෙන් රු. 100557.20 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම මෙහිදී මතක් කරන්න ඕනෙ මීට මාස තුනකට උඩදි අපි පොත් ගෙනාව. ඒ ගේන කොට පරිවර්තන තමයි ගොඩක් ගෙනල්ල තියෙන්නෙ. නවකතා ගෙනිල්ල නැහැ. ඒ නිසා නැවතත් රු. 100000/- ක් දුන්නා ඒ පොත් ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම අදහසක් දෙන්නෙ. අපි කීප සැරයක්ම එක කරා. පාසල් වලින් එක් එක් අංශ වලින් උසස් පෙළ හොඳින් සමත් ළමයිනුත් ගැරුවරුත් කීප දෙනෙක් අරගෙන එගොල්ලන්ට දෙන්න පොත් තෝරන්න. අද යල් පැන ගිය ඒව හරියන්නෙ නැහැ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒ තත්වය නිසා තමයි කිසිම බාහිර පාර්ශවයක් නැතිව අපේ නිලධාරීන් ගිහින් ළමයි ඉල්ලන පොත් ගේන්න කියල කිව්වෙ. මොකද අපි රැස්වීම් කීපයකට ගියා පෙර පාසල් නිල ඇඳුම් රෙදි බෙදා දෙන්න. එහිදී ළමයි කිව්ව මේ පාර ගෙනිල්ල තියෙන්නෙ පරිවර්ථන විතරයි කියලා. මම ඊට පස්සෙ පුස්තකාල කාර්ය මණ්ඩලයත් එක්ක කතා කරල තමයි ළමයි ඉල්ලන දේ ආපහු ගේනන දුන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මටත් ළමයි ඔය ගැන කිව්ව. ඒ නිසා ළමයිනුයි ගුරුවරුනුයි දාල පොත් තේරීම කරන්න. 10% ක් නවකතා ගන්න. ඒවගේම දැන් ඉංග්‍රීසි පාඨමාලා තියෙනවා. ඒවට හරියන පොත් ඒවගේම දෙමළ පොත් ප්‍රතිශතයක් විදියට අරගෙන ගේන්න. එකම විදියට ගෙනාවොත් පුස්තකාලෙන් වැඩක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පුස්තකාල ගැන කතා කරද්දි අපි e- laibrary ගැන කතා කරා. දැන් අළුතින් හඳුන්වල දීල තියෙනව ඕනම පොතක් සිංහලෙන් ඇතුල් කරල තියෙනව කියවන්න පුළුවන්. එකෙ ආරම්භක ප්‍රවේශයක් විදියට අපිට පරිගණක දෙකක් විතර තමයි අවශ්‍ය වෙන්නෙ. මේක විශාල වශයෙන් කරන්න හිටියොත් කෙරෙන්නෙ නෑ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

එකට වෙනම ඉදිකිරීමක් කරන්න ඕනෙ. එක ඕසයින් කරල තියෙන්නෙ. මේ අවුරුද්දෙ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපේ කලින් එකක් තිබුණනෙ අන්තර්ජාල පහසුකම් තියෙන. මේක ළමයින්ට විශාල ප්‍රයෝජනයක් වෙනවා. ඒ නිසා මේ සම්බන්ධව සොයල එක ස්ථානගත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා සභාපතිතුමනි.

8.35 2013 ජනවාරි මාසය සඳහා ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රු. 16803.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 ආණ්ඩුකරණය හා දේශපාලනය පිළිබඳ සහතිකපත් පාඨමාලාව හැදෑරීම සඳහා ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා වෙනුවෙන් රු. 34000/- ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ සම්බන්ධව මීට කලින් සභාවේදී මේකට කැමති කෙනෙකුට ඉදිරිපත් වෙන්න කියල ඔබතුමා කිව්ව. අනුර කිත්සිරි මන්ත්‍රීතුමා ඒකට ඉදිරිපත් වෙලා ඒකට සුදුසුකම් ලබල තියෙනවා. එතුමා තෝරා ගැනීම සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙනවා.

8.37 2012 ඔක්තෝම්බර් සිට 2013 ජනවාරි දක්වා මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රු. 96000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.38 පෝරඹ දේවාල පාර කාණු පද්ධතිය සහ මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් අදාල රැඳවුම් මුදල වන රු. 30353.57 ක මුදලක් ඕකන්ද ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 ජනවාරි මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 ජනවාරි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** කරෝලිස් වෙද මාවත කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 26698.50 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** ගාළු පාර දොළොස්මහ සේල් අසල නගර සභා ළිඳ ප්‍රතිසංස්කරණය සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 190289.61 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** ඕකන්ද පුස්තකාලය හා පෙර පාසලේ සිවිලිම ප්‍රතිසංස්කරණය සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 487305.72 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** ධම්මකුසල මාවත කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 203963.38 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** තල්ගස්ගොඩ පෙර පාසල ප්‍රතිසංස්කරණය සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 353608.09 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.6** පටබැඳිගෙදරවත්ත දෙවට I කාණු කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 34171.50 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** හිරේවත්ත බුදු පිළිමය අසල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 216363.24 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

තීරණය

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.8** පින්නදුව දෙවන හරස් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 313717.03 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.9** පොල්වත්ත පෙර පාසල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 374202.84 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.10** කෙරමිණිය දෙවන හරස් පාර කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 312461.22 ක් වු ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>තීරණය</u>**

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## **(11)** වෙනත් කරුණු

## **(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවු වෙනත් කරුණු

**12:1** **‘** බැනරය ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම **’** මැයෙන් ගා/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

2011 වසරේ සාමාන්‍ය පෙළ විභාගයෙන් අම්බලන්ගොඩ කලාපයේ හොඳම ප්‍රතිඵල ලබා දීම සම්බන්ධයෙන් ගුරුභවතුන්ට සුභ පැතුම් එක් කරමින් ඉදිරිපත් කර ඇති බැනරය මුදල් අයකිරීමකින් තොරව බස් නැවතුම් පොලෙහි ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **ගා/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලයේ බැනරයක් බස් නැවතුම්පොල ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීම සඳහා මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ‘ හල්වතුර යෝජනා ක්‍රමයේ මා හට දුන් ඉඩම පිළිබඳවයි ’ මැයෙන් අම්බලන්ගොඩ, කැටැන්තොට, ජී. ජී. ආරියදාස මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

තමා දැනට මානාන ක්‍රීඩා පිටියේ ජීවත් වන බවත් ඉහත කී ඉඩම ලබා දුන් විගස මානාන ක්‍රීඩා පිටියේ දැනට පදිංචි බිම් කොටස නගර සභාවට භාර දෙන බවත් තමා හට ඉහත ඉඩම ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි ඕකෙ නැද්ද ඉන්න අයට ඒ හරියෙ දෙන්න මොකක් හරි ඉඩමක්. එතකොට ප්‍රශ්නෙ ඉවරයිනෙ.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

මන්ත්‍රීතුමා අපි මේ ඉඩම මේ අයට දුන්නෙ 1999. මෙයා ගෙයි ගහ ගත්තෙ එක්සත් ජාතික පක්ෂය පාලනයට ආපු ගමන්ම වගේ. ඊට පස්සෙ ජී. එම්. එස්. මහත්තය නඩුවක් දැම්ම අනවසර ඉදිකිරීම් යටතේ. ඒ අනුව දැන් නඩුවෙ අවසාන කියවීම තියෙන්නෙ. අපි ඇත්තටම මේ මහත්මයට මේ ඉඩම දුන්නෙ මානාන පිට්ටනිය හැදීමට අවශ්‍ය ඒ ඉඩම ලබා ගැනීමට. නමුත් එයා ආවෙනෑ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි දැන් මේකෙ වෙච්ච දේවල් ගැන බලන්නෙ නැතුව ඔබතුමා මේ ප්‍රශ්නෙ නිරාකරණය කරල දාන්න බලන්න. කොහොම කරත් අසරණ මිනිස්සුනෙ. මේක පූර්වාදර්ශයක් නොවෙන්න කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි නඩුවෙ තීන්දුව එනකම් ඉන්න ඕනෙ. ඒ තීන්දුව තමයි අවසාන තීරනේ වෙන්නෙ. තීන්දුවෙන් එන දේ නගර සභාව ක්‍රියාත්මක කරන්න ඕනෙ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි යම් විදියකට මේක අනිත් පැත්තට පෙරලුනයි කියල වෙනත් කෙනෙකුට එහෙම අයිතියක් දෙන්න විදියක් නැහැ.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

මේකෙ මහ ඇමතිතුමා නිරීක්ෂණ ඉල්ලල තිබුණ. අපි යැව්ව.

තීරණය

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මේ සඳහා නඩු තීන්දුව ලබා දුන් පසු තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.**

පෙ. ව. 10.55 ට තේ විවේකය සඳහා සභාවේ වැඩ කටයුතු නතර කරන ලදී.

පෙ. ව. 11.05 ට තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදී.

**12:3** ‘ රජයේ ඉඩම් ආඥා පනත අනුව ඉඩම් දීර්ඝකාලීන බදු දීම ’ මැයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

රජයේ ඉඩම් ආඥා පනතට අනුව ඉඩම් වලට බදුකර සකස් කිරීමේදී අදාළ පලාත් පාලන ආයතනයේ එකගතාවය ලබා ගත යුතු බවත් එමළු කගතාවය ඇතැම් අවස්ථාවලදී සුළු ප්‍රමාදයකින් ලැබෙන බවත් ඒ හේතුවෙන් රජය වෙත ලැබිය යුතු බදු මුදල් අප්‍රමාදව ලබා ගැනීමට නොහැකි වීම නිසා රජයට ලැබිය යුතු ආදායම මගහැරීමට හේතුවිය හැකි බැවින් මේ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ අදාල නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

තීරණය

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:4** ‘ ව්‍යාපාරික ස්ථානයන් වෙත බදු උපදෙස් ලබා දීමේ දීප ව්‍යාප්ත වැඩසටහන ’ මැයෙන් දේශිය ආදායම් ප්‍රාදේශීය කාර්යාලයේ නියෝජ්‍ය කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

උක්ත වැඩ සටහන ඔබ බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරන කාලය තුල අඩි 6 X 4 ප්‍රමාණයේ බැනර කිහිපයක් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බැනර කිහිපයක් ගාස්තු අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** ‘ නගර සභා පෙර පාසල් දරු දැරියන්ගේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සඳහා මුදල් ලබා දීම පිළිබඳව ’ මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභා පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් විසින් පෙර පාසලේ දරුවන්ගේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සඳහා එක් පෙර පාසලක් සඳහා බස් රථයකට වැය වන මුදල වන රු 15000/- ක මුදලින් අඩක් වන රු 7500/- ක මුදලක් සභා අරමුදලින් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීම් කල බවත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**තීරණය**</u>

☞ **නගර සභා පෙර පාසල් සඳහා එක් පෙර පාසලකට රු. 7500/- බැගින් විනෝද චාරිකාව යාම සඳහා ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:6** ' දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය ' මැයෙන් අම්බලන්ගොඩ දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

ධර්මාශෝක විද්‍යාලයේ සියවස් සැමරුම් උත්සවය වෙනුවෙන් සැණකෙළියක් හා වෙළඳ ප්‍රදර්ශනයක් 2013 මාර්තු මස 27 සිට 31 දක්වා දිනවල අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් එයට සමගාමීව ඒ සඳහා අනුග්‍රාහකත්වය ලබා දෙන ආයතන වල කොඩි, දැන්වීම් පුවරු ගාලු පාර දෙපස ප්‍රදර්ශනය කිරීමට මුදල් අය කිරීමකින් තොරව අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි ධර්මාශෝක විද්‍යාලයේ තියෙන රංගශාලාවේ පවත්වන ප්‍රසංග සඳහා විනෝද බදු අය කරන්නෙ නැති තත්වයක් නේද තියෙන්නෙ. විදුහල්පතිතුමා දැනුවත් කරල තියන්න එහෙම දෙයක් තියෙන කොට විනෝද බදු අය කරන බව.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

සියළුම විදුහල්පතිවරුන් දැනුවත් කරන්න. පාසල ඇතුලත ටිකට් කඩන දෙයක් කරනව නම් විනෝද බදු අය කිරීම කල යුතු බව.

<u>**තීරණය**</u>

☞ **අනුග්‍රාහක භවතුන්ගේ කොඩි, දැන්වීම් පුවරු ගාලු පාර දෙපස මුදල් අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:7** ' දැනට පවතින මාර්ගය කොන්ක්‍රීට් කර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමයි ' මැයෙන් අම්බලන්ගොඩ, මහාවීදියේ, බී. එච්. ජේ. ද සිල්වා මහතා විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ, බෝගහවත්ත, පටබැඳිගෙදරවත්ත නම් දුම්රිය මාර්ගයට යාබද වූ ඉඩමේ බොරළු පාරේ ගමන් ගන්නා ඉඩම් හිමිකරුවන් 05 දෙනෙකු සඳහා දැනට පවතින මාර්ගය බලපිටිය ප්‍රාදේශීය සභාවෙන් නවතා ඇති තැන සිට කොන්ක්‍රීට් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඉහත මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දුන් අතර අදාල පවරා ගැනීම් ලිපි ඉදිරිපත් කරන ලෙස දන්වා යැවීමට සභාව තීරණය කරන ලදී.**

**12:8** ‘ පඩි පාලක සභාව විසින් අනුමත කර ඇති නව වැටුප් ක්‍රමය ලබා දෙන ලෙස ඉල්ලීම ’ මැයෙන් ආරක්ෂක අංශයේ මහත්මාවන් 09 දෙනෙකු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ආරක්ෂක සේවා කර්මාන්තයේ පඩි පාලක සභාව විසින් ආරක්ෂක අංශ සේවකයින්ගේ වැටුප් වැඩි කරන ලද 2012/12/18 දිනැති ගැසට් පත්‍රය අනුව නව වැටුප් ක්‍රමය 2013/01/01 දින සිට වලංගු වන බවත් ඒ අනුව වැටුප් සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ආරක්ෂක අංශය සඳහා 2012/ 12/ 18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව 2013/ 010/ 01 දින සිට නව වැටුප් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:8** ‘ පවුල් සෞඛ්‍ය සේවා මාසික වාර්තාව- 2013 ජනවාරි මාසය ’ මැයෙන් ප්‍රජා සංවර්ධන නිලධාරී තුමිය විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවට අනුයුක්තව සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිළධාරීන් දෙදෙනා විසින් පෝරඹ සහ විලේගොඩ කොට්ඨාශ වල මාසිකව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| **කාර්යයන්** | **කොට්ඨාශය** | |
|---|---|---|
| | **පෝරඹ** | **විලේගොඩ** |
| | | |
| **<u>යෝග්‍යතා පවුල් පිළිබඳ තොරතුරු</u>** | | |
| ප. සෞ. නි. භාරයේ සිටින යෝග්‍යතා පවුල් ගණන | 435 | 433 |
| මාසය තුල කරන ලද මුළු ගෘහ ඇවිදීම් ගණන | 129 | 112 |
| | | |
| **<u>පූර්ව ප්‍රසව සංරක්ෂණය</u>** | | |
| ප. සෞ. නි. භාරයේ සිටින ගර්භනී මව්වරු ගණන | 19 | 26 |

| | | |
|---|---|---|
| ප. සෞ. නි. විසින් පූර්ව ප්‍රසව මව්වරුන් සඳහා කරන ගෘහ ඇවිදීම් | 18 | 22 |
| පූර්ව ප්‍රසව මව්වරුන්ගේ සායනයට පැමිණීම | 33 | 31 |
| **ප්‍රසව සංරක්ෂණය** | | |
| වාර්තා කල මුළු ප්‍රසූත ගණන | 08 | 04 |
| ප. සෞ. නි. භාරයේ සිටින පසු ප්‍රසව මව්වරු ගණන | 06 | 09 |
| | | |
| **සංරක්ෂණය** | | |
| සිටින ළදරුවන් ගණන | 40 | 43 |
| | | |
| | | |
| පෙර පාසල් ළමුන් ගණන | | |
| අවු. 1 සිට අවු. 2 දක්වා | 40 | 48 |
| අවු. 2 සිට අවු. 5 දක්වා | 103 | 131 |
| පෙර පාසල් දරුවන් සඳහා කරන ගෘහ ඇවිදීම් ගණන | 36 | 51 |
| කිරන ලද පෙර පාසල් දරුවන් ගණන | | |
| අවු. 1 සිට අවු. 2 දක්වා | 21 | 42 |
| අවු. 2 සිට අවු. 5 දක්වා | 45 | 121 |
| අඩු බර සහිත දරුවන් ගණන | | |
| අවු. 1 සිට අවු. 2 දක්වා | 05 | 04 |
| අවු. 2 සිට අවු. 5 දක්වා | 11 | 05 |
| | | |
| **පවුල් සංවිධාන ක්‍රියාකාරකම්** | | |
| සම්මන්ත්‍රණ පැවැත්වූ ගණන | - | - |
| පැවැත්වූ රැස්වීම් හා සමුළු ගණන | 04 | 03 |
| සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ගණන | 02 | 02 |
| පාසල් සෞඛ්‍ය වැඩසටහන් ගණන | - | - |

**තීරණය**

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

🕘 **පෙ. ව. 11.15 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**12:9** ‘ 2013- 02- 18 දින පැවති සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු යෝජනා ’ මැයෙන් සංවර්ධන සහකාර මිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුවේදී අයාලේ යන සුනඛ ගැහැණු සතුන් සඳහා වන්ධ්‍යාකරණ සැත්කම සිදු කිරීමේදී එක් සතෙකු සඳහා රු. 1350/- ක මුදලක් වැය වන බවත් බල ප්‍රදේශය තුල මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ වෙනකොට සුනඛයින් 300 කට විතර මේ සැත්කම රජය මගින් කරල තියෙනවා. සමීක්ෂණය අනුව ගැහැණු සතුන් 1500 ක් විතර ඉන්නව කියල තියෙනවා. තව 1200 ක් විතර කරන්න තියෙනවා. යන වියදම ටිකක් වැඩියි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මේක කරන්න ඕන එකක්. දැන් සුනඛයින් මරන්නෙත් නැනෙ. ඇත්තටම අපි ඩෙංගු වලට සැහෙන්න වියදම් කරනවා හැබැයි මේක මිනිස්සු අතරට යන්නත් ඕනෙ. අපි මෙතරම් ප්‍රමාණයක් වියදම් කරනව කියලා. මේ දේත් කරන්න කියල අපි ඉල්ලා සිටිනවා.

ඒවගේම සභාපතිතුමා නගරයේ තියෙන කාණු ටිකට වැඩ පිළිවෙලක් සකස් කරන්න. සමහර වෙලාවට සුද්ධ කරන අය ගියත් ස්ලැබ් දාපු නිසා සුද්ධ කරන්න අපහසුයි. නගරය තුල තියෙන කාණුවල පතුල කැඩිල තියෙන්නෙ. දැන් නෙස්ටර් එක ලග බලන්න කාණු , ධීවර සංකීර්ණය ලග බලන්න.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

ඒ පාරවල් අපිට අයිති නෑ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

ඒ වුනාට මිනිස්සු බනින්නෙ නගර සභාවට. මිනිස්සු දන්නැහැ මේක කොහේ පාරක්ද කියලා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

ලේකම්තුමා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යෝජනාවක් කරන්න දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට සහ මාර්ග සංවර්ධන අධිකාරියට දන්වන්න කියල මාර්ග වල කාණු සුද්ධ කරල දෙන්න කියලා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි වසර තුනකට පමණ පෙර කිව්ව බුදු පිළිමය ඉදිරිපිට තියෙන සුනාමියට කැඩුන කාණුව ඉංජිනේරු මහත්මියත් ඇවිල්ල නිරීක්ෂණ කටයුතු කරා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

අපි මේ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේදි කතා කරමු. එතනදි නිලධාරීන් ඉන්නවනෙ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි සම්බන්ධීකරණ කමිටුවට අපේ නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට හැකියාවක් තියෙනව නම් හොඳයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මෙතනදි සම්බන්ධීකරණ කමිටුව නොමග යැවීමක් වගෙත් කරල තියෙනවා. ඒ නිලධාරීන් දීර්ඝව කිව්ව ඒව හැදුවයි කියලා. අපේ නගර සීමාවට ආසන්නයේ තියෙන කොන්ක්‍රීට් තහඩු අබලන් තත්වයේ තියෙන්නේ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

අපි මේ සුනඛයින් සැත්කම් කිරීම සම්බන්ධයෙන් අවසර දෙනවද?

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඇත්තටම මේක විය යුතු දෙයක්. ඉතා හොඳ කාර්යක් ඒ නිලධාරීන් කරනු ලැබුව ඇත්තටම. අපේ නගරයේ ජනතාව විශාල වශයෙන් පීඩාවට පත්වුන දෙයක්. බස් නැවතුම්පොලේ දෙතුන්පාරක් බල්ලන් සපා කෑම පවා සිදු වුනා. සෞඛ්‍ය කමිටුවේ නිලධාරීන්ට අපගේ විශේෂ ස්තුතිය පුද කල යුතු වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේ සැත්කම කරයි කියලම ජලභීතිකාව සුව කරන්න බැහැ. මම හිතනව අපි මෙච්චර මුදලක් වියදම් කරල කෙනෙක් කෑවොත් මම ඊයෙ පත්තරෙත් දැක්ක ගාල්ල රෝහලෙත් ජල භීතිකාවට බෙහෙත් නැහැ කියලා. මේක තමයි බරපතලම ප්‍රශ්නෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

බලපිටියෙ රෝහලේ නම් තියෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**

මම හිතනවා ඕකට වඩා වැදගත් වන්නේ ජලභීතිකාව ගැන බැලීමයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ අවුරුද්දෙ බජට් එකෙන් වෙන් කරල තියෙනව ලක්ෂ තුනක් ජලභීතිකා රෝගය සඳහා. එකෙන් අපි මේක කරමු.

තීරණය

☞ **නගර සභා බල ප්‍රදේශය තුල සුනඛයින් වන්ධ්‍යාකරණ සැත්කම සිදු කිරීමට අවශ්‍ය වියදම් දැරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. මේ සඳහා පුද්ගලික අංශයේ අනුග්‍රහය ලබා ගැනීමට හැකි නම් ඒ සඳහා කටයුතු කිරීමටද තීරණය කරන ලදී.**

**12:10** ' බැංකු ගාස්තු ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබා ගැනීම- 2012 ඔක්තෝම්බර්/ නොවැම්බර්/ දෙසැම්බර් ' මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

පොදු ගිණුමට අදාලව ඉහත මාසයන් වෙනුවෙන් අම්බලන්ගොඩ මහජන බැංකුව බැංකු ගාස්තු වශයෙන් රු. 6245.70 ක මුදලක් සෘජුවම අයකරගෙන ඇති බවත් එය ගෙවීමක් වශයෙන් ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **බැංකු ගාස්තු වෙනුවෙන් අයකර ඇති රු.6245/- ක මුදල ගෙවීමක් වශයෙන් ගිණුම්ගත කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** ' නගර සභා ක්‍රිකට් ඇකඩමියේ පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම ' මැයෙන් ක්‍රීඩා භූමි උපදේශක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

නගර සභා ක්‍රිකට් ඇකඩමියේ මේ වන විට ක්‍රිඩකයන් 80 ක් පමණ පුහුණු වීම් ලබන බවත් ඔවුන් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට සහ පුහුණුකරුවකු සඳහා මසකට රු. 6000/- බැගින් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **නගර සභා ක්‍රිකට් ඇකඩමිය සඳහා ඉල්ලා ඇති උපකරණ ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:12** ' 2013 පෙබරවාරි මස වාර්තාව ' මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබු දින ගණන 18 ක් බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 267 ක් බවත් ඖෂධ සඳහා වැයවු මුදල රු. 17384.64 ක් බවත් එක් රෝගියෙක් සඳහා වැයවු මුදල රු. 65.00 ක් බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:13** ' ආරක්ෂිත පාවහන් සහ ආරක්ෂිත ඇඳුම් කට්ටල ලබා ගැනීම ' මැයෙන් සල්පගේ ක්‍රිෂාන්ත සහ බුද්ධික චන්ද්‍රලාල් යන මහතුන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ආරක්ෂාව සඳහා රාජකාරී අවස්ථාවල ආරක්ෂිත ඇඳුම් කට්ටල හැඳ පැලඳ ගෙන සිටීම අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය ඇඳුම් කට්ටල ලබා දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **ඉහත නම් සඳහන් සේවකයින් සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල හා ආරක්ෂිත පාවහන් ලබා දීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:14** ' චන්ද්‍රාවාස පාර අංක 15 - 17 දරණ නිවාස ඉදිරිපිට කාණු පද්ධතිය සැකසීමේ කර්මාන්තය සම්බන්ධව ' මැයෙන් වැඩ අධිකාරීතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉහත කර්මාන්තය සෘජු ශ්‍රමික පදනම මත ඉටුකරන ලද අතර 2013-01-23 දින කර්මාන්තයේ වැඩ අවසන් කරන ලද බවත් ඒ සඳහා රු. 72857.50 ක මුදලක් වැයවූ බවත් ඇස්තමේන්තු මුදල රු. 127466.60 ක් බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:15** ' ජලනල එළීම සඳහා මාර්ගය පළුදු කිරීම ' මැයෙන් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ගාල්ල කළමනාකරු අයි. ඩී. විජේසිරි මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ජල සම්පාදන ක්‍රමයෙන් තල්ගස්ගොඩ 'සිනමන් ටෙරස්' ඉඩමට ජල නළ දීර්ඝ කිරීම සඳහා නගර සභාවට අයත් තාර පාර හරහා ව. මී. 3.0 X 0.3 හා 1.0 X 0.5 ක ප්‍රමාණයක් පළුදු කිරීමට අවශ්‍ය බවත් ඒ සඳහා වන ඇස්තමේන්තු මුදල අදාල පළාත් පාලන ආයතනයට ගෙවා ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>

මේ සම්බන්ධව සැලසුම් කමිටුවෙදිත් කතා කරා. මේකෙදි ඉස්සෙල්ලම අපට අයිති ඉඩම් කැබැල්ලක් පාරක් සඳහා මිලදී ගත්තා. ඊට එහා පැත්තෙ අක්කර 6 ක නගර සභා සීමාවෙන් පිට ඉඩමක් තමයි කැබලි කරෙ. මේකෙදි අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවෙ නීති රීති වලට අනුව සංවර්ධනය කරල නැහැ. පාරවල් වලට උඩින් චිප් ගල් දාල තමයි මේව වික්කෙ. මේ ගල් සේරම හෝදගෙන ඇවිල්ල අද වෙනකෙට නගර සභා සීමාවට අයිති පාරවල් සම්පූර්ණෙන්ම ඇහිරිලා තියෙන්නෙ. මේගොල්ලන්ට එහා පැත්තෙන් පාර තියෙනවා. අධික මිලකට ඉඩම දෙන්න ඕන නිසා තමයි නගර සභා සීමාවට අයත් ඉඩම් කැබැල්ල සල්ලි වලට අරගෙන මේක කරෙ. විස්කම් පෙදෙසෙ තියෙන කාණු පද්ධතිය මේ වන කොට ඇහිරිලා තියෙන්නෙ මේ චිප්ගල් හෝදන් ඇවිල්ලා. ඒ නිසා මේකට ඉඩ දෙන්න එපා කියල තමයි මම කියන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහතා මේ නිසා අපට ඇතිවෙලා තියෙන ගැටළු මොනවද? මේක ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරල තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ප්‍රාදේශීය සභාවෙන් අනුමත කරන්න පුළුවන්. අපේ ක්‍රමවේදයක් තියෙනවනෙ. එහෙම නම් කාණු සුද්ද කරල ඒ ක්‍රමවේදෙට යන්න කියන්න. අපිට මුදල් වැය කරන්න බැහැනෙ කාගෙවත් කොන්ත්‍රාත් එහෙකට.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරීතුමා ලබන සභාවට අපට මේ නිසා අපට වන හානිය පිළිබඳව වාර්තාවක් දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි සිනමන් ටෙරස් කියල නම් කරල තියෙන්නෙ මේව වෙළඳ නාම විතරයි. මම නිලධාරීන්ගෙන් ඉල්ලා සිටිනවා ඉදිරියේදී මේ වෙළඳ නාම වලට ගිහිල්ලා මේව අනුමත කරන්න යන්න එපා. අපිට ගම්වල ප්‍රශ්න එනවා. එනිසා මම ඉල්ලා සිටිනවා නිලධාරීන් මෙම වෙළඳ නාමයන් මේ සභාවෙ පාවිච්චි කරන්න එපා කියලා.

<u>තීරණය</u>

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මේ නිසා නගර සභාවට සිදුවී ඇති හානිය පිළිබඳව වාර්තාවක් ලබන සභාවට ඉදිරිපත් කරන ලෙසට තීරණය කරන ලදී.**

**12:16** ‘ පළාත් පාලන කාර්ය සාධන තරගය - 2013 ’ මැයෙන් වැඩ අධිකාරීතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉහත තරගය සඳහා නගර සභා මාර්ග ශුද්ධ කිරීම, නගර සභා මාර්ග අළුත්වැඩියා කිරීම, නගර සභා කාණු පද්ධති අළුත්වැඩියා කිරීම, නගර සභා ගොඩනැගිලි අළුත්වැඩියාව, මාර්ග සංඥා සහ නාම පුවරු අළුත්වැඩියා කිරීම යන කටයුතු 2013 වර්ෂය වෙනුවෙන් සිදු කිරීමට සකස් කරන ලද ක්‍රියාකාරී සැලසුම සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඉහත දක්වා ඇති සංවර්ධන කටයුතු සිදු කිරීමට සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:17** ' ගලි බවුසරය අළුත් වැඩියාව. ' මැයෙන් වැඩ අධිකාරීතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී. GL- 9369 අංක දරණ ගලි බවුසරය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (ක්ලච් ප්ලේට්, රේසර) ලබා ගැනීම සඳහා එම වාහනය මිලදී ගත් ආයතනය වන සතොස මෝටර්ස් වෙතින්ම රු. 62772.97 ක මුදලක් ගෙවා ලබා ගැනීමට අනුමැතිය ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ගලි බවුසරය අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සතොස මෝටර්ස් ආයතනයට රු. 62772.97 ක් ගෙවා ලබා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:18** ' ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ F.A. කප් පාපන්දු තරගාවලිය- 2013 තරගාවලිය නියෝජනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම ' මැයෙන් නගර සභා පාපන්දු සංචිතයේ පුහුණුකරු ඉදුනිල් එදිරිවික්‍රමසූරිය මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා පාපන්දු සංචිතය පසුගිය වර්ෂයේ F.A. කප් පාපන්දු තරගාවලියට සහභාගී වී D කාණ්ඩයේ අර්ධ අවසන් පූර්ව තරගය දක්වා ඉදිරියට ගිය බවත් මෙම වර්ෂයේ මෙම තරගාවලිය සඳහා පාසල් ක්‍රීඩකයන් 30 දෙනෙකු තෝරාගෙන ඇති බවත් ඒ සඳහා වැය වෙතැයි බලාපොරොත්තු වන ඇස්තමේන්තුව රු. 33000/- ක් බවත් මේ සඳහා අනුග්‍රහය අනුමැතිය හා ආශීර්වාදය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2013 - F.A. කප් පාපන්දු තරගාවලිය සඳහා සහභාගි වීමට අනුමැතිය සහ ඉදිරිපත් කර ඇති රු. 33000/- වූ ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. එම මුදල ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:19** ' දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය ' මැයෙන් අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ධර්මාශෝක විද්‍යාලයේ සියවස් සැමරුම් උත්සවය වෙනුවෙන් සැණකෙළියක් හා වෙළඳ ප්‍රදර්ශනයක් 2013 මාර්තු මස 27 සිට 31 දක්වා දිනවල අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බවත් ඒ වෙනුවෙන් නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර විනෝද බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මීට පෙර අනිකුත් විද්‍යාල වලටත් අපි විනෝද බදු නිදහස් කරා. ඒ නිසා ධර්මාශෝක විද්‍යාලයටත් ලබා දීම සුදුසුයි කියල මම හිතනවා.

**<u>තීරණය</u>**

☞ **දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය විනෝද බදු වලින් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ ## වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, මට ලිපියක් එවල තියෙනව ඔබතුමාට පිටපතක් සහිතව කේ. ඩබ්. හේමන්ත, කෙරමිණිය, අම්බලන්ගොඩ. මේ පාර මුලින් අඩි 12 ට කැපුවෙ ශ්‍රමදානෙන් කරේ.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

එතන පෞද්ගලික දෙයක් තියෙන්නෙ. අරගොල්ලන් පාරෙ ගල් වගයක් දාල. මම දාල ඇති එක ඉවත් කරන්නයි කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒ සිද්ධිය මම දැක්කා. ඒ අදාල පුද්ගලයන් ළිදෙන් බාගයක් ස්ලැබ් එකක් දාල වහල තියෙන්නෙ ළිදේ ආරක්ෂාවට කියලා. නමුත් ඒ ළිඳ කිසිම පරිහරණයක් කරන්නෙ නෑ.. ඊට පල්ලෙහා ගෙදර ඩෙංගු රෝගියෙකුත් වාර්තා වුනා. සමහර විට මෙතන සෞඛ්‍යයට අහිතකර තත්වයක් තියෙන්නත් පුළුවන්. මම පී. එච්. අයි. මහත්මයගෙන් ඉල්ලීමක් කරනවා ඒ ළිඳ සෞඛ්‍යාරක්ෂිත තත්වයෙන් තියෙනවද කියල වාර්තාවක් දෙන්න කියලා. මේ පාර අඩි 16 ට ඇක්වයර් කරල තියෙන්නෙ.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අඩි 16 ට ඇක්වයර් කරල තිබුනට මිනිස්සු කැමැත්තෙන් දුන්නෙ අඩි 12 යි. අනිත් හරිය අපි ගත්ත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

ඔය අදාල ප්‍රශ්නෙ තියෙන පුද්ගලයන්ම ඉස්සරහ ඉඩමක් අරන් තියෙනව ඒ ඉඩම වැට ගහල තියෙන්නෙ අගල් 6 ක් විතර මෙහා. ඒ ගැන සුපරීක්ෂාකාරී කරන්න කියල මම වැඩ අධිකාරීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

පී. එච්. අයි. මහත්මයා ළිඳ සම්බන්ධයෙන් බලන්න. වැඩ අධිකාරී මහත්මය වැට සම්බන්ධයෙන් බලන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ළිං ගැන කතා කරපු නිසා මම අහන්නෙ මෙතන කරිත්තකන්ද පන්සල ලඟ තියෙන ළිඳ ඉතාමත් අනතුරුදායක තත්වයක තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

සභාපතිතුමනි එඬේරමුල්ලෙ එල්. ඒ. බන්දුල සිල්වා මහත්මය එතුමාගේ ඉඩම් සම්බන්ධව දහ දෙනෙක් අත්සන් කරල ලිපියක් යොමු කරල තියෙනව. සභාපතිතුමාටත් ලිපියක් යොමු කරල තියෙනවා. "අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් ඉඩම් වලට වන්දි නොගෙවා අවුරුදු 24 ක් තුල ප්‍රයෝජනයට නොගෙන වල් බිහිවී ඇති බැවින් එම ඉඩම් ආපසු ලබා ගැනීම සඳහා කරන ඉල්ලීමයි " කියල. මේ කියන්නෙ මානාන ක්‍රීඩාපිටියට අරගෙන දැනට සංවර්ධනය නොකරපු ඩඉම්.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒක සංවර්ධනය කරමින් යනව. එක පාරට සංවර්ධනය කරන්න බැහැනෙ. අනිවාර්යයෙන්ම ඒ ක්‍රීඩාපිටිය හදනවා.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

මේ ලියුම නාගරික සංවර්ධන අධිකාරියට දාල තියෙන්නෙ ලියුම. ඒකෙ පිටපත් දාල තියෙනව ජනාධිපතිතුමාට, ආරක්ෂක ලේකම්තුමාට, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමාට, ගාල්ල නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාට, අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිතුමාට පිටපත් දාල තියෙනවා.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේ සම්බන්ධයෙන් අපි තීරණයක් ගත්ත මන්ත්‍රීතුමා. අවසතු කිරීමක් අවශ්‍යනම් ඒක කරන්න කියලා. පවරා ගැනීම් කරල තියෙන්නෙ අපි නෙමෙයි. නාගරික සංවර්ධන අධිකාරිය. ඉඩම් හිමියන්ගේ ඉඩම් ආපසු ඒ අය ඉල්ලා සිටිනව නම් අපේ එකගතාවය පල කරා. හල්වතුර ව්‍යාපෘතියට අත්පත් කර ගත්ත ඒවනම් අපි එකගතාවය පල කරල තියෙන්නෙ අවසතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

තව ලිපියක් තියෙනවා සභාපතිතුමනි තල්ගස්ගොඩ, සුදුවැල්ල පාර බී. එච්. බන්දුල ද සිල්වා මහතා ලිපියක් ඉදිරිපත් කරල තියෙනව නීතියට පටහැනිව නිවසේ වහල සකස් කිරීම හා සම්බන්ධවයි කියල. සුදුවැල්ල පාරේ පී. ඩබ්. ඉන්දික නැමැත්තා විසින් තනාගෙන යන නිවසේ වහල . ..

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේක ගොඩනැගිලි ලිපිකරුට දාල ඇත්තෙ සැලසුම් කමිටුවට දාන්න.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පටබැඳිමුල්ලෙ ළමා උද්‍යානයේ ලිස්සන බෝට්ටුවක් පිහිටුවීම කියන මගේ ඉල්ලීමට මනූෂ නානායක්කාර මැතිතුමා රු. 50000/- ක ප්‍රතිපාදන ලබා දුන්නා. ඒක ස්ථානගත කරල ළමයින්ට ක්‍රීඩා කරන්න ලබා දීල තියෙනවා. මන්ත්‍රීතුමාට ස්තුති කරල ලිපියක් යවන්න ඕනෙ.

ප. ව. **12.00** ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභා ගර්භයෙන් පිටව යන ලදී.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ගියවර සභාවෙ අපි කතා කරා සුනාමි ව්‍යසනයට ගොදුරු වු දරුවන්ට නගරයේ පාසල් වැහේ කියල මාතෘකාය යටතේ 02/06 වෙනිද දිනමිණ පත්තරේ පලවුන ප්‍රවෘත්තිය අනුව මේ වන විට ක්‍රියාත්මක වෙලා තියෙනවා. මම ස්තුතිවන්ත වෙනවා ඒ මාධ්‍යවේදී මහත්මාට. මොකද අද වෙනකොට ඒ පාසැල් නොමැතිව සිටි ළමයි මානව හිමිකම් හරහා මේ වෙනකොට සහනයක් ලැබෙයි කියන තත්වය තියෙනවා. අපි මේ සභාවෙ ළමයි වෙනුවෙන් කතා කරල ඒ ළමයින්ට සහනයක් වෙනව නම් නගරයේ දරුවන් වෙනුවෙන් කරන්න පුළුවන් ලොකුම දේ එයයි. මහජන නියෝජිතයන් වශයෙන් අපි 12 දෙනාම එක හඬින් හිටිය නගරයේ ළමයි නගරයේ පාසැල් වලට ඇතුලත් කර ගත යුතුයි කියලා. නමුත් කණගාටුවට කරුණක් මේ වනවිට විවිධ කටකතා යනව මේ සම්බන්ධව. අපි සභාව මැදිහත්වෙලා මානව හිමිකම් එක හරහා හරි මේ ළමයි පාසල් වලට ඇතුලත් වෙනව නම් මේ නගරයේ දරුවන් වෙනුවෙන් කරන යහපත් කාර්යක් කියල මම හිතනවා. මම විශේෂයෙන්ම දිනමිණ පුවත්පතටත් ඒ මාධ්‍යවේදී මහතාටත් නගරයේ වැසියන් වෙනුවෙන් ස්තුතිවන්ත වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ප්‍රදේශයේ සෞඛ්‍ය ගැටළු සම්බන්ධව කතා කරද්දි ඩෙංගු උවදුර සම්බන්ධයෙන් මම දිගින් දිගටම කතා කරා ධූමායන කටයුතු සම්බන්ධව. මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඩෙංගු රෝගීන් දිගින් දිගටම වාර්තා වෙනවා. නමුත් ධූමායන කටයුතු සිද්ද වුනේ නැහැ.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

පී. එච්. අයි. මහතා ඒ හරිය ධූමායනය කරේ නැද්ද. දැන් ඕගොල්ලන් සුජාතා පෙර පාසල ලගට ගියාද? අනවබෝධයෙන් පාසලක් වහන දෙයක් වගේ එකක් කරන්න හොදනෑ. මේ ස්ථානයත් එක්ක බලන කොට මගේ ගෙදරටත් ධූමායනය කරන්න ඕනෙ. මීටර 500 ක් ඇතුලත නිසා. කිත්සිරි මන්ත්‍රීතුමා කියන එකත් බලන්න. වාර්තාව ගෙනල්ලත් තියෙනවනේ.

මෙතනදි අපි ධූමායන කටයුතු වලට මුදල් ලබා දුන්නට මේ මැෂින් එක තියෙන්නෙ මගේ භාරයේ නෙමෙයි. එම්. ඕ. එච්. භාරයේ තියෙන්නෙ. දිස්ත්‍රික්කයෙන් තුනෙන් එකකටම එකයි.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මැෂින් එකකුත් අරගෙන දෙන්න. අපි මෙච්චර වියදම් කරන එකේ.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

සභාව මේකට මිල ගණන් පිලිගත්ත. ඒකෙ නිර්දේශය ගන්න සෞඛ්‍ය අමාත්‍යාංශෙට යැව්ව. තාමත් නෑ. පී. එච්. අයි. මහත්මය ඔබතුමා ගිහිල්ල මේකෙ නිර්දේශෙ අරගෙන එන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

ගරු සභාපතිතුමනි යම් කරුණු කාරණා පැහැදිලි කිරීම් වලදි ඔබතුමා විසින් කියන කාරණාව වැඩ නොකිරීමට සමහර නිලධාරීන් ඒක උත්ප්‍රේරක කර ගන්නවා. දැන් මම සාක්ෂියකුත් දුන්නනෙ. ඔතෙන්ට ගිහිල්ල තියෙනවා නිලධාරීන්. එහෙම තියෙද්දිත් ධූමායන කටයුතු සිද්ධ වෙලා නැහැ. මේ ආකාරයට මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඩෙංගු රෝගයට ගොදුරු වෙච්ච රෝගීන් ඉන්නව ගණනාවක්. මේක කියල කියල කරන්න වුවමනාවක් නැහැ. එතකොට හිතන්නෙ නිලධාරීන් විරුද්ධව කතා කරනව කියලා. අපි ප්‍රජාව වෙනුවෙන් කතා කරන දේවල් මේ තියෙන සංහිඳියාව බිඳීමට පාදක කර ගන්නව. අපේ ව්‍යාපාරිකයින් ප්‍රදේශවාසීන් පවා කැමති වෙලා තියෙනව ධූමායන කටයුතු සඳහා වියදම් දැරීමට. මේ ධූමායන කටයුත්තට එක මැෂින් එකයි කියන දේ ප්‍රමාණවත් නොවන දෙයක්.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේක ගාල්ලෙ ඉංජිනේරුතුමා ලගට යවන්න. මේකෙ මිල ගණන් සභාවෙ පිලිගත්තා. නිර්දේශය දාන්න නිලධාරීන්ට දාල තියෙන්නෙ. ඒ මිල ගණන් වලට දැන් ගන්න පුළුවන්ද දන්නෙ නැහැ. පී. එච්. අයි. මහත්මය ඔබතුමා නිර්දේශ කරල දෙන්න හොඳ එක මොකක්ද කියල.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

ගරු සභාපතිතුමනි ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් මේකට අනුමැතිය දීල තියෙනව. ඔබතුමත් අනුමැතිය දීල තියෙනව මන්ත්‍රීවරුන් සමගම. පොල්වත්තපුර ඔප්පු ලබා දීම සම්බන්ධව. මේකෙ යෝජනාව ගෙනල්ල සම්මත වෙලා මාස ගානක් වෙනවා. මෙතෙක් මොනම ක්‍රියා මාර්ගයක්වත් අරගෙන නැහැ.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේකෙ ප්‍රගතිය කොහොමද පුෂ්පකුමාර මහතා? ඔයාට උපදේශයක් දුන්නා මේකට කරන දේ.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

මේක දැන් මාස ගානක් වෙනවා අපේ කාලයත් ඉවර වෙනවා. ඔප්පු දීගන්න බැරි වෙනවා. මේක සම්බන්ධව සභාපතිතුමා වෙනම නිලධාරියෙක් හරි පත් කරල මේක කරන්න.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේකෙ ඉඩම් කච්චේරියක් පවත්වන්න ඕනෙ පළමුවෙන්ම. ඉඩම අපේ. මැනුමක් තියෙනවනම් ඒ මැනුමට අදාලව කොහොමද ඊට වැඩිය ඉන්නවද සියල්ලම පරීක්ෂණ කරන්න ඕනෙ. ඉඩම් කච්චේරි නිර්දේශය සභාවට ඉදිරිපත් කරන්න ඕනෙ. ඊට පස්සෙ ඇමතිතුමාට යවන්න ඕනෙ. ඉඩම් කැබලි දෙකක් සම්බන්ධව විතරයි ගැටළුවක් තියෙන්නෙ. ඒක ලියන්න ඕනෙ ප්‍රාදේශීය ලේකම්තුමාටයි, මහ ඇමතිතුමාටයි විතරයි. කට වචනෙට කරන්න බැහැ. වාර්තා තියෙන්න ඕනෙ. පිළිවෙලට වැඩ ටික කරල තියෙන්න ඕනෙ. නැත්තම් අරහෙට ගියහම ආයෙ එවනව.

ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා ලේකම් මහතා, ප්‍රධාන කළමනාකරණ සහකාර මිය, ප්‍රධාන ආදායම් නිලධාරී මහතා, වැඩ අධිකාරී මහතා යන අයත් ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී ජනිත් වික්‍රමතිලක මහතා යන අයත් පත් කිරීමට සභාව තීරණය කරන ලදී.

මේ සියළු දෙනාම කමිටුවට කැඳවන්න ඕනෙ. කමිටුවෙදි දෙන්නෙ කාටද කියල තීන්දු කරන්න ඕනෙ. ජී. එම්. එස්. මහත්මයගෙ කාලෙ ණය ලබා දීපු ලිපිගොනුවක් ඇති. ඒව බලල එතනින් පටන් අරගෙන ඒ වැඩේ කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපි ප්‍රජාශාලා ගොඩනැගිලි ඇති කරල තියෙනව. මේව නඩත්තු කිරීමක් කරන්න ඕනෙ. ඒවගේම ආරක්ෂා වෙන විදියට මොකක් හරි ක්‍රමවේදයකට යන්න ඕනෙ. ඒවගේම සභාපතිතුමනි සුසානභූමි ගත්තහම පොල්වත්ත සුසාන භූමියේ කාණු පිරිල මම හිතන්නෙ සුද්ද කරන එක්කෙනෙක් නැහැ. පාරෙ කොල වැටිල අඩියක් විතර. නිලධාරීන් අධීක්ෂණය කරන්නෙත් නැනෙ. අම්බලන්ගොඩත් ඒවගේම තමයි. බංකු ටිකක් ගහල පිලිවෙලකට හදන්න. ලස්සනට මල් ගස් හිටවලා හදන්න සභාපතිතුමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි පටබැඳිමුල් සුසාන භූමියේ පිටිපස්සෙ වහලෙ උළු ගිහිපු එක මාස දෙක තුනකට කලිනුත් කිව්ව. තාම ක්‍රියාත්මක වෙලා නැහැ. ලී දිරල යන තත්වෙට ඇවිල්ල තියෙන්නෙ. උළු නැත්තම් තහඩුවකින් හරි වහල දාන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහත්මය මේක තියෙන තැනකින් බලල අරගෙන එන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපි මේව පෙන්නල දෙන්නෙ පොඩි වැඩේට අපි හැමෝටම බනිනවා. අපි මහජන නියෝජිතයන් වශයෙන් මේව බලන්නෙ නැ කියල තමයි කියන්නෙ. අපි දෙයක් කිව්වම මාස ගානක් යවන්න එපා. මේ කරන්න පුළුවන් දේවල් තමන් දන්නැත්තම් ඉහල නිලධාරියෙක්ගෙන් අහල හරි මේව කරන්න ඕනෙ. අපි මේව පෙන්නල දෙන්නෙ මිනිස්සු දොස් කියන්නෙ අපි හැමෝටම නිසයි. මහජන දේපල ආරක්ෂා කිරීමේ වගකීම අපට තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අර ඉඩම සම්බන්ධව තීරණය අරගෙන තියෙන්නෙ 2013-01-08 සභාවෙ 12:1 අනුව හල්වතුර ඉඩම් අක්කර 200 සම්බන්ධව තියෙන්නේ ඉඩමෙ භුක්තිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාරදීමට එකග වුනා කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ ප්‍රදේශයට බස් රථයක් ලබා දෙන එකට සියළු දේවල් සපිරිලා ඇවිල්ල තියෙනව. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට සහ මන්ත්‍රී මඩුල්ලටම ස්තුතිවන්ත වෙනවා. ආසන 26 ක බස් රථයක් තමයි යොදවන්නෙ. ඒ සම්බන්ධව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, මාර්ග සංවර්ධන අධිකාරියටත් ස්තුතිය පිරිනමනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි

✍ **ප. ව. 02.35 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

ඩී. වී. සුනිල්,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 02 – 27 දින,**

**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**